# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# 2017 வருடாந்த செயற்பாட்டு அறிக்கை
# Annual Performance Report



මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය
மாநகர மற்றும் மேல் மாகாண அபிவிருத்தி அமைச்சு
Ministry of Megapolis and Western Development

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය

# වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2017

17 මහල, සුහුරුපාය, බත්තරමුල්ල
www.megapolismin.gov.lk

# මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය

## ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා (පා.ම.)

### අමාත්‍ය, මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය

**අමාත්‍යාංශයේ ප්‍රධාන මාණ්ඩලික නිලධාරීන්**

**නිහාල් රූපසිංහ මහතා**

*ලේකම්, මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය*

**කේ.ඩබ්ලිව්.පී. දයාරත්න මිය**

*අතිරේක ලේකම් (පාලන)*

**මාධව වෛද්‍යරත්න මහතා**

*අතිරේක ලේකම් (මහානගර)*

**අංජලී දේවරාජා මිය**

*අතිරේක ලේකම් (මහානගර, තාක්ෂණ හා බස්නාහිර සංවර්ධන)*

**ඩබ්ලිව්.එම්.කේ.පී.එස්.ආර්. ප්‍රනාන්දු මහතා**

*අතිරේක ලේකම් (තාක්ෂණ)*

**ඒ.ඩබ්ලිව්.එම්. සරත්චන්ද්‍ර**

*අතිරේක ලේකම් (නාගරික සංවර්ධන)*

පටුන


1. මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය ........................................ 1-2

2. අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය ............................................................. 2

3. ආංශික කාර්යසාධනය

3.1 පාලන අංශය ........................................................................ 3-8

3.2 ගිණුම් අංශය.......................................................................... 8-11

3.3 නාගරික සංවර්ධන අංශය

3.3.1 නාගරික සංවර්ධන අංශය ........................................ 12-13

3.3.2 සැලසුම් හා මෙහෙයුම් අංශය ..................................... 13-14

3.3.3 ඉඩම් අංශය ........................................................... 14-15

3.3.4 නාගරික පරිසර කලමනාකරණ අංශය ............................ 15

3.4 මහානගර සැලසුම් අංශය .......................................................... 16-19

3.5 තාක්ෂණ අංශය ..................................................................... 20

3.6 අභ්‍යන්තර විගණන අංශය ........................................................ 21

4. අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යවස්ථාපිත ආයතන සහ දෙපාර්තමේන්තු .................. 21-22

5. අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති

5.1 විදේශීය අරමුදල් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති .............................. 23-24

5.2 දේශීය අරමුදල් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති .............................. 24-26

# 1. මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය

## දැක්ම

ජනතාවගේ ආර්ථික හා ආධ්‍යාත්මික යහපැවැත්ම මෙන්ම ස්වභාව ධර්මය සමග සුසංයෝගී වූ ප්‍රියමනාප දිවිපැවැත්මක් සහතික කරන තිරසර නාගරික ජීවිතයක්

## මෙහෙවර

විශිෂ්ට නගර සැලසුම් හා ඉංජිනේරු නිපුණතා, අතිනවීන තාක්ෂණය සහ ලෝකයේ විශිෂ්ට භාවිතාවන් යොදා ගනිමින්, රටේ ක්‍රමෝපායික වශයෙන් වැදගත් ස්ථානවල මැනවින් සැලසුම් කරන ලද හරිත, පවිත්‍ර සහ සුහුරු නාගරික ජනාවාස නිර්මාණය කිරීම තුළින් දේශයේ ආර්ථික සමෘද්ධිය සාක්ෂාත් කර ගැනීම සහ ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම

## අරමුණු

අමාත්‍යාංශයේ මූලික අරමුණ වන්නේ ජන ජීවිතයේ ගුණාත්මකභාවය ඉහළ මට්ටමකින් පවත්වා ගන්නා අතරම නාගරික ප්‍රදේශවල වාසය කරන ජනතාව රටේ සමාජ ආර්ථික සංවර්ධන ක්‍රියාදාමයේ කොටස්කරුවන් වන බවට සහතික කරන්නා වූ විධිමත් වෙනස්කම් සහ සංවර්ධන ක්‍රියාදාමයන් නාගරික ප්‍රජාව වෙත ගෙන ඒමය. මෙමගින් ශ්‍රී ලංකාව ආසියාවේ වාණිජ, නාවික හා ගුවන් මධ්‍යස්ථානයක් බවට පත් කිරීමේ මග සැලසෙයි.

මෙම අමාත්‍යාංශයේ මූලික වගකීම් අතරට සමස්ථ ශ්‍රී ලංකාවටම අදාළ ජාතික භෞතික සැලසුම සකස් කිරීමත්, උපාය මාර්ගික හා පොදු නාගරික සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීමත් ඇතුළත් වේ. එසේම මීළඟ වසර පහ තුළ සමස්ත බස්නාහිර පළාතේ පරිපූර්ණ සංවර්ධනයක් ඇතිකරලීමේ අරමුණින් එය මහානගරයක් බවට පරිවර්තනය කිරීමට අමාත්‍යාංශය අපේක්ෂා කරයි.

බස්නාහිර කලාප මහානගර සංවර්ධන ක්‍රියාවලිය ශ්‍රී ලංකාවේ දිගු කාලීන හා මැනවින් ප්‍රතිෂ්ඨාපිත, තිරසාර අනාගත නාගරික ක්‍රියාදාමයට මග හෙළිකරන සංවර්ධන අපිකේන්ද්‍රයක් සේ ක්‍රියාකරනු ඇත. රටේ ක්‍රමෝපායික වශයෙන් වැදගත් ස්ථානයන්හි සුහුරු නාගරික ජනාවාස සැලසුම් කිරීමට අමතරව එමගින් නාගරීකරණය නිසා නිර්මාණය වූ කැලිකසල, මුඩුක්කු, බලශක්තිය, රථවාහන තදබදය, පරිසරය සහ ජීවනෝපාය ආශ්‍රිතව හටගත් නිශ්චිත ගැටළු සඳහා අවශ්‍ය විසඳුම් ලබාදීමටද වැයම් කරනු ඇත.

## අමාත්‍යාංශය යටතේ පවතින ව්‍යවස්ථාපිත ආයතන,දෙපාර්තමේන්තු සහ ව්‍යාපෘති

- ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව
- නාගරික සංවර්ධන අධිකාරිය
- ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව
- බස්නාහිර කලාපීය ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය
- කොළඹ අගනගර ආශ්‍රිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය
- බස්නාහිර කලාපීය තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතිය
- බස්නාහිර කලාපීය ගුවන් නගර සංවර්ධන ව්‍යාපෘතිය
- බස්නාහිර කලාපීය සමුද්‍රීය නගර සංවර්ධන ව්‍යාපෘතිය
- බස්නාහිර කලාපීය පරිපාලන නගර සංවර්ධන ව්‍යාපෘතිය
- ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය සඳහා ප්‍රධාන සැලසුමක් සකස් කිරීම

**අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විදේශීය අරමුදල් ව්‍යාපෘති**

- උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය (මහනුවර, ගාල්ල, යාපනය, අනුරාධපුරය)
- කොළඹ නගරය ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය
- මහ කොළඹ නාගරික ප්‍රවාහන ජාල වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ නගර සංවර්ධන උපාංගය (3K)
- සැහැල්ලු දුම්රිය ප්‍රවාහන පද්ධති ව්‍යාපෘතිය
- කොළඹ අගනගරය ආශ්‍රිත ගංවතුර බලපෑම් අවම කිරීමේ හා නාගරික පරිසර භාර අරමුදල

## 2. අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය

කරුණාකර ඇමුණුම අංක 01 බලන්න

# 3. ආංශික කාර්යසාධනය

## 3.1 පාලන අංශය

### 3.1.1 වගකීම

අදාල කාර්යයන් කාර්යක්ෂමව, කඩිනම්ව, ගුණාත්මකව හා අඛණ්ඩව පොදුවේ සැමට පිළිගත හැකි තත්ත්වයන්ට හා ප්‍රමිතීන්ට අනුව ඉටු කිරීම

### 3.1.2 අංශය මගින් ඉටුකරනු ලබන ප්‍රධාන කාර්යයන්

අමාත්‍යාංශ නිලධාරීන්ගේ, අමාත්‍ය සහ නියෝජ්‍ය අමාත්‍ය කාර්ය මණ්ඩල නිලධාරීන්ගේ සියලුම ආයතන කටයුතු සහ අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සහ ව්‍යාපෘතිවල සේවයේ නියුතු නිලධාරීන් සම්බන්ධයෙන් ඉටු කළ යුතු සියලුම ආයතන කටයුතු

### 3.1.3 අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු

| කාණ්ඩය | අනුමත තනතුරු සංඛ්‍යාව | 2017.12.31 දිනට සිටි සංඛ්‍යාව | පුරප්පාඩු/ අතිරික්ත (ඇත්නම්) |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 36 | 31 | 05 (පුරප්පාඩු) |
| තෘතීයික | 06 | 02 | 04 (පුරප්පාඩු) |
| ද්විතීයික | 93 | 69 | 24 (පුරප්පාඩු) |
| ප්‍රාථමික | 46 | 37 | 09 (පුරප්පාඩු) |
| **එකතුව** | **181** | **139** | **42 (පුරප්පාඩු)** |

- අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ වෙනස්වීම්

| කාණ්ඩය | 2017.12.31 දිනට | | | |
|---|---|---|---|---|
| | ස්ථාන මාරුවී ගිය | ස්ථාන මාරුවී පැමිණි | විශ්‍රාම ගැනීම් | ඉල්ලා අස්වීම් |
| ජ්‍යෙෂ්ඨ | 01 | - | - | - |
| තෘතීයික | - | - | - | - |
| ද්විතීයික | 02 | 01 | 01 | - |
| ප්‍රාථමික | - | - | 01 | - |
| **එකතුව** | **03** | **01** | **02** | **-** |

- පුහුණුවීම්
  - දේශීය පුහුණුවීම් - පුහුණු, වැඩමුළු හා සම්මන්ත්‍රණ

| වැඩසටහන් ප්‍රමාණය | සහභාගීවූවන් ගණන | අමාත්‍යාංශය දරා ඇති මුළු වියදම (රු.) |
|---|---|---|
| 25 | 122 | 859,507.00 |

**2017 දේශීය පුහුණු**

| අනු අංකය | නම සහ තනතුර | සහභාගීවූ වැඩසටහන/පාඨමාලාව | කාලසීමාව |
|---|---|---|---|
| 1 | නෙරංජා ආර්. නිශ්ශංක මිය ප්‍රධාන ගණකාධිකාරී (ව්‍යාපෘති හා ප්‍රසම්පාදන) | රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 2017.08.05 සිට මාස 10ක් ඉදිරියට (සති අන්ත දින පමණයි) |
| 2 | ප්‍රියංගා සේනාරත්න මෙනෙවිය - සහකාර අධ්‍යක්ෂ (මහානගර සැලසුම්) | (1) ව්‍යාපෘති (2) ඩිජිටල් රජය (3) සයිබර් ආරක්ෂණය සහ සයිබර් අවකාශයේ ආචාර ධර්ම | 2017.08.11 |
| 3 | එස්.කේ. මනෝජා මෙනෙවිය - සහකාර අධ්‍යක්ෂ (මහානගර සැලසුම්) | (1) ඩිජිටල් රජය (2) සයිබර් ආරක්ෂණය සහ සයිබර් අවකාශයේ ආචාර ධර්ම | 2017.08.11 |
| 4 | එච්.සී.එස්. ද සොයිසා මයා - සහකාර අධ්‍යක්ෂ (මහානගර සැලසුම්) | විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය (1) ඩිජිටල් රජය (2) සයිබර් ආරක්ෂණය සහ සයිබර් අවකාශයේ ආචාර ධර්ම | 2017.08.11 |
| 5 | ජේ.එම්. දිසානායක මිය - සහකාර ලේකම් (පාලන) | ප්‍රතිපත්ති ලේඛන ලිවීම පිළිබඳ වැඩමුළුව | 2017.07.13 |
| 6 | ජේ.එම්. දිසානායක මිය - සහකාර ලේකම් (පාලන) | 1) ඩිජිටල් රජය (2) සයිබර් ආරක්ෂණය සහ සයිබර් අවකාශයේ ආචාර ධර්ම | 2017.07.28 |
| 7 | එන්.ජී.ටී. පෙරේරා මෙය සහකාර අධ්‍යක්ෂ (සැලසුම් හා මෙහෙයුම්) | වාර්තා ලිවීමේ මූලික පුහුණු පාඨමාලාව | 2017.09.11-2017.09.13 |
| 8 | අයි.කේ.ඩබ්.එන්. වික්‍රමරත්න මෙය සහකාර අධ්‍යක්ෂ (සැලසුම් හා මෙහෙයුම්) | | |
| 9 | ඩබ්.එම්.සී.එස්.කේ. විජේසුන්දර මෙය, සහකාර අධ්‍යක්ෂ (ඉඩම්) | පර්යේෂණ යෝජනා ලිවීම පිළිබඳ වැඩමුළුව | 2017.05.23 |
| 10 | බී.එස්.එම්.කේ.එස්. සෙනෙවිරත්න මයා (සංවර්ධන නිලධාරි) | රථවාහන හා යන්ත්‍ර සූත්‍ර පරිපාලනය | 2017.03.28 සිට 29 |
| 11 | පී.කේ.ඒ. ප්‍රේමකුමාර මයා (සංවර්ධන නිලධාරි) | නායකත්ව හා කණ්ඩායම් ගොඩනැගීම | 2017.04.01 සිට 03 |
| 12 | කේ.ජී.එස්. අබේනායක මයා (සංවර්ධන නිලධාරි) | සේවා ස්ථානයේ ඉහළ ඵලදායිතාවයක් සඳහා කාල කළමනාකරණය | 2017.05.17 සිට 18 |
| 13 | කේ.ආර්.පී. එරන්දි මිය (සංවර්ධන නිලධාරි) | අන්තර් පුද්ගල සබඳතා හා මහජන සබඳතා | 2017.05.22 |
| 14 | ජේ.ඒ.අයි. ලක්මාලි මිය (සංවර්ධන නිලධාරි) | ලේඛන කළමනාකරණය සහ සංරක්ෂණය පිළිබඳ පාඨමාලාව | 2017.05.29 සිට 06.02 |
| 15 | කේ.ඒ. අනුරාධා මහේෂී මිය (සංවර්ධන නිලධාරි) | | |
| 16 | ජේ.ඒ. ඉරෝෂා ලක්මාලී මිය (සංවර්ධන නිලධාරි) | රජයේ ප්‍රසම්පාදන කළමනාකරණය | 2017.07.24 සිට 26 |
| 17 | ආර්.බී.පී. පතිරණ මිය (සංවර්ධන නිලධාරි) | ලිපි ගොනු කළමනාකරණය කාර්යාල පරිපාලනය සහ ආයතන සංග්‍රහ විධිවිධාන | 2017.08.28 සිට 30 |

| අනු අංකය | නම සහ තනතුර | සහභාගීවූ වැඩසටහන/පාඨමාලාව | කාලසීමාව |
|---|---|---|---|
| 18 | ජී.ඊ. රණධීර මිය (සංවර්ධන නිලධාරි) | ලිපි ගොනු කළමනාකරණය කාර්යාල පරිපාලනය සහ ආයතන සංග්‍රහ විධිවිධාන | 2017.08.28 සිට 30 |
| 19 | ඩබ්.එම්. හතරසිංහ මිය (සංවර්ධන නිලධාරි) | රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පුහුණු වැඩමුළුව | 2017.10.11 සිට 13 |
| 20 | එම්.එච්.පී.ජේ. වීරතිලක මිය (සංවර්ධන නිලධාරි) | | |
| 21 | එච්. හර්ෂනී ප්‍රියංගා මිය (සංවර්ධන නිලධාරි) | ලිපිගොනු කළමනාකරණය, පරිපාලනය හා ආයතන සංග්‍රහ විධිවිධාන | 2017.10.23 සිට 25 |
| 22 | ඩී.යූ.එන්.එස්. කුමාරි මිය (සංවර්ධන නිලධාරි) | පරිගණකගත රජයේ වැටුප් ගෙවීම් පද්ධතිය | 2017.10.25 සිට 27 |
| 23 | ඩී.එස්. රණතුංග මිය සංවර්ධන නිලධාරි | රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | එක් අවුරුදු පාඨමාලාවකි |
| 24 | එල්.එන්. අමරසිංහ මෙය (රාජ්‍ය කළමනාකරණ සහකාර) | ආයතන සංග්‍රහයේ විධිවිධාන පිළිබඳව | 2017.04.20- සිට 21 |
| 25 | එච්.ඒ.එම්.එම්. හතුරුසිංහ මයා (රාජ්‍ය කළමනාකරණ සහකාර) | | |
| 26 | එච්.ඒ.එම්.එම්. හතුරුසිංහ මයා (රාජ්‍ය කළමනාකරණ සහකාර) | ගිණුම්කරණ කාර්යභාරය හා ප්‍රායෝගික භාවිතය | 2017.04.27 සිට 28 |
| 27 | ජී.කේ.පී. මල්කාන්ති මිය (රාජ්‍ය කළමනාකරණ සහකාර) | | |
| 28 | ඩබ්.එම්.එස්.එම්. වීරසිංහ මෙය (රාජ්‍ය කළමනාකරණ සහකාර) | අන්තර් පුද්ගල සබඳතා හා මහජන සබඳතා | 2017.05.22 |
| 29 | අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 25ක් පමණ | දෙමළ භාෂාව | 2017.06.15 සිට නොවැම්බර් දක්වා |
| 30 | ජී.කේ.පී. මල්කාන්ති මිය (රාජ්‍ය කළමනාකරණ සහකාර) | ආයතන සංග්‍රහයේ විධිවිධාන පිළිබඳව | 2017.07.27 සිට 28 |
| 31 | ආර්.කේ.ඩී.කේ. රණමුක මෙය (රාජ්‍ය කළමනාකරණ සහකාර) | | |
| 32 | ඩී.ජේ.එම්.එච්. ගුණවර්ධන මෙය (රාජ්‍ය කළමනාකරණ සහකාර) | ලිපි ගොනු කළමනාකරණය කාර්යාල පරිපාලනය සහ ආයතන සංග්‍රහ විධිවිධාන | 2017.08.28 සිට 30 |
| 33 | එම්.ජේ.ඒ.ඩී.එච්.සී. ජයසුන්දර මෙය (රාජ්‍ය කළමනාකරණ සහකාර) | | |
| 34 | එම්.එන්.එෆ්. රිස්නියා මිය (රාජ්‍ය කළමනාකරණ සහකාර) | | |
| 35 | ඩබ්.ඒ.ආර්.ඩී.එම්. වික්‍රමසිංහ මෙය (රාජ්‍ය කළමනාකරණ සහකාර) | | |
| 36 | ඊ.එම්.ඕ. සඳමාලී මෙය (රාජ්‍ය කළමනාකරණ සහකාර) | | |
| 37 | අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය නිලධාරීන් 50ක් | රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය | 2017.09.09 |
| 38 | ජී.කේ.පී. මල්කාන්ති මිය (රාජ්‍ය කළමනාකරණ සහකාර) | රාජකාරී ලිපි ලිවීම සම්බන්ධ මූලික පාඨමාලාව | 2017.09.25 සිට 26 |
| 39 | යූ.අයි. රත්නසිංහ මෙය (රාජ්‍ය කළමනාකරණ සහකාර) | ලිපිගොනු කළමනාකරණය, පරිපාලනය හා ආයතන සංග්‍රහ විධිවිධාන | 2017.10.23 සිට 25 |

| අනු අංකය | නම සහ තනතුර | සහභාගීවූ වැඩසටහන /පාඨමාලාව | කාලසීමාව |
|---|---|---|---|
| 40 | ඩී.ඩී.මංචනායක මෙය (රාජ්‍ය කළමනාකරණ සහකාර) | ලිපිගොනු කළමනාකරණය, පරිපාලනය හා ආයතන සංග්‍රහ විධිවිධාන | 2017.10.23 සිට 25 |
| 41 | එච්.පී.පී. එච්.දිසානායක මෙය (රාජ්‍ය කළමනාකරණ සහකාර) | ලිපිගොනු කළමනාකරණය, පරිපාලනය හා ආයතන සංග්‍රහ විධිවිධාන | 2017.10.23 සිට 25 |
| 42 | අමාත්‍යාංශ රියදුරු කාර්ය මණ්ඩලය | මෝටර් රථ වාහන නඩත්තුව හා මාර්ග නීති රීති පිළිබඳ දැනුවත් කිරීම | 2017.07.29 |
| 43 | කේ.පී. පැතුම් සඳරුවන් මයා කාර්යාල කාර්ය සහායක | ගුණාත්මක වැඩ පරිසරයක් සඳහා වෘත්තීය සංවර්ධනය | 2017.05.26 |
| 44 | ඩී.එම්. දයා මැණිකේ මිය කාර්යාල කාර්ය සහායක | | |

- විදේශ පුහුණුවීම්

| වැඩසටහන් ප්‍රමාණය | සහභාගී වූ මාණ්ඩලික නිලධාරීන් ගණන | සහභාගී වූ අනෙකුත් නිලධාරීන් ගණන | අමාත්‍යාංශය දරා ඇති මුළු වියදම (රුපියල්) |
|---|---|---|---|
| 30 | 16 | 05 | 9,050,199.65 |

**2017 විදේශ පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ හා දූතමණ්ඩල**

| අනු අංකය | නම හා තනතුර | පාඨමාලාව /වැඩසටහන | රට | කාලසීමාව |
|---|---|---|---|---|
| 1 | කේ. ඩබ්. පී. දයාරත්න මිය අතිරේක ලේකම් (පාලන) | සංවර්ධිත රටවල් සඳහා නාගරීකරණය පිළිබඳ කාර්මික ව්‍යුහය සකස් කිරීම සහ සැලසුම් කිරීම පිළිබඳ සම්මන්ත්‍රණය - 2017 | චීනය | 2017 .03.31 සිට 04.20 දක්වා |
| | | බෙල්ට් රෝඩ් රටවල් සඳහා ආර්ථික සංවර්ධන හා සැලසුම් පිළිබඳ අමාත්‍යවරුන්ගේ වැඩමුළුව - 2017 | චීනය | 2017.07.11 සිට 07. 20 දක්වා |
| 2 | ඉංජි. පී. සුරේෂ් මහතා අතිරේක ලේකම් (නාගරික සංවර්ධන) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ගැඹුරු තාක්ෂණික ධාවකය | ජපානය | 2017 .03.21 සිට 24 දක්වා |
| | | Temasek සංවිධානය මගින් රාජ්‍ය ප්‍රධානීන් සඳහා 10 වැනි ආසියානු නාගරික සංසදයට ලැබුණු ආරාධනය අනුව සහභාගී වීම | සිංගප්පූරුව | 2017 .07. 17 සිට 22 දක්වා |
| 3 | මාධව වෛද්‍යරත්න මහතා අතිරේක ලේකම් (මහානගර) | ලෝක නගර සමුළු නගරාධිපතිවරුන්ගේ සංසදය -2017 | චීනය | 2017 .05. 17 සිට 05. 19 දක්වා |
| | | අමාත්‍යවරුන්ගේ නියෝජිත මණ්ඩලය | ස්විඩනය සහ ඩෙන්මාර්කය | 2017 06.06 සිට 10 දක්වා |
| | | බෙල්ට් රෝඩ් රටවල් සඳහා ආර්ථික සංවර්ධන හා සැලසුම් පිළිබඳ අමාත්‍යවරුන්ගේ වැඩමුළුව - 2017 | චීනය | 2017 .07.11 සිට 20 දක්වා |
| | | විද්‍යා හා තාක්ෂණ උද්‍යාන පිළිබඳ ආසියා පැසිෆික් සංසදය | චීනය | 2017 11.28 සිට 29 දක්වා |

| අනු අංකය | නම හා තනතුර | පාඨමාලාව /වැඩසටහන | රට | කාලසීමාව |
|---|---|---|---|---|
| 4 | එස්.කේ.ඒ. දේවරාජා මිය, අතිරේක ලේකම් (මහානගර, තාක්ෂණ සහ බස්නාහිර සංවර්ධන) | ඉසුරුමත් ජාතිය පිළිබඳ පාඨමාලාව: ක්‍රියාත්මක කිරීම සඳහා වූ උපායමාර්ග | සිංගප්පූරුව | 2017.06.12 සිට 16 දක්වා |
| | | තිරසාර නාගරික සංවර්ධන සඳහා නාගරික කළමනාකරණය | ජපානය | 2017 .10.15 සිට 28 දක්වා |
| 5 | එච්.පී. ලලිත් කුමාර මහතා, (ප්‍රධාන ගණකාධිකාරී) | දෙවැනි විදේශීය අධ්‍යයන චාරිකාව රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය (MPM) වැඩසටහන (SLIDA වැඩසටහන හරහා ) | චීනය | 2017 02.28 සිට 03.10 දක්වා |
| | | මූල්‍ය කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණය සහ ශ්‍රී ලංකාව සඳහා ශුන්‍ය පදනම් අයවැය ක්‍රමය - 2017 | චීනය | 2017 .05. 23 සිට 06. 12 දක්වා |
| 6 | එන්.ආර්. නිශ්ශංකා මිය, (ප්‍රධාන ගණකාධිකාරී ව්‍යාපෘති හා ප්‍රසම්පාදන) | මූල්‍ය කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණය සහ ශ්‍රී ලංකාව සඳහා ශුන්‍ය පදනම් අයවැය ක්‍රමය - 2017 | චීනය | 2017 .05.23 සිට 06. 12 දක්වා |
| 7 | ඩී.එම්.කේ.එස්. දිසානායක මහතා, අධ්‍යක්ෂ (නාගරික සංවර්ධන) | රයිනියන් දූපතෙහි අධ්‍යයන චාරිකාව | Reunion Island | 2017. 04.01 සිට 07 දක්වා |
| | | වාර්ෂික උපදේශන රැස්වීම 2017 | ප්‍රංශය | 2017 .07. 10 හා 11 දක්වා |
| 8 | අනෝජා හේරත් මිය, අධ්‍යක්ෂ ( පරිසර) | දකුණු සහ අග්නිදිග ආසියාව තුළ ඇති GHG ඉන්වෙන්ට්‍රි | තායිලන්තය | 2017 .09.11 සිට 14 දක්වා |
| 9 | එස්.ආර්.බී.ආර්.ජී.සී. ගන්නොරුව මිය, අධ්‍යක්ෂ (මහානගර සැලසුම්) | ආයෝජකයින්ගේ සංසදය හා දැනුම හුවමාරු වැඩසටහන | කොරියාව | 2017 .06. 26 සිට 30 දක්වා |
| | | විස්තීර්ණ නගර සැලසුම්කරණය | ජපානය | 2017 .09. 05 සිට 10. 28 දක්වා |
| 10 | එම්.එස්. රත්නසිංහ මහතා, සහකාර අධ්‍යක්ෂ (නාගරික සංවර්ධන) | ආසියානු කලාපයේ ප්‍රවර්ධන පද්ධති සංවර්ධනය කිරීම | ජපානය | 2017 07. 12 සිට 08.11 දක්වා |
| 11 | ඩී.එන්. අතුකෝරල මිය, සහකාර අධ්‍යක්ෂ (ඉඩම් සහ සැලසුම්) | කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය කලාපයේ හා සමාන මුහුදු ගොඩකර නගර නිර්මිත රටවල පරිසර ගැටළු කළමනාකරණය පිළිබඳ අත්දැකීම් හුවමාරුව සඳහා ව්‍යාපෘති නිලධාරී නියෝජිතයන්ගේ සංචාරය | ඩුබායි, මැලේසියාව, සිංගප්පූරුව | 2017 .11.03 සිට 09 දක්වා |
| 12 | එල්.පී. පී. කොස්තා මිය, සහකාර අධ්‍යක්ෂ (නාගරික ඉඩම් කළමනාකරණ) | | | |

| අනු අංකය | නම හා තනතුර | පාඨමාලාව /වැඩසටහන | රට | කාලසීමාව |
|---|---|---|---|---|
| 13 | අයි.කේ.ඩබ්.එන්. වික්‍රමරත්න මෙය, සහකාර අධ්‍යක්ෂ (සැලසුම් සහ මෙහෙයුම්) | සංවර්ධිත රටවල් සඳහා නාගරීකරණය පිළිබඳ කාර්මික ව්‍යුහය සකස් කිරීම හා සැලසුම් කිරීම පිළිබඳ සම්මන්ත්‍රණය - 2017 | චීනය | 2017 03.31 සිට 04. 20 දක්වා |
| 14 | එන්.ජී. ටී. පෙරේරා මෙය, සහකාර අධ්‍යක්ෂ (සැලසුම් සහ මෙහෙයුම්) | | | |
| 15 | එච්.සී. එස්. ද සොයිසා මහතා, සහකාර අධ්‍යක්ෂ (මහානගර සැලසුම්) | | | |
| 16 | එස්.කේ. මනෝජා මෙය, සහකාර අධ්‍යක්ෂ (මහානගර සැලසුම්) | විද්‍යාව හා තාක්ෂණික සංවර්ධනය පිළිබඳ දැනුම හා තොරතුරු හුවමාරු වැඩසටහන | කොරියාව | 2017 .07.16 සිට 22 දක්වා |
| 17 | බී.එස්. එම්. ඒ. කේ. එස්. සෙනෙවිරත්න මහතා, (සංවර්ධන නිලධාරි) | ආසියානු රටවල් සඳහා කර්මාන්ත උද්‍යාන සැලසුම් කිරීම, ඉදිකිරීම හා කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණය | චීනය | 2017 .05. 10 සිට 06. 06 දක්වා |
| 18 | ආර්.කේ. සී. පී. ගුණවර්ධන මිය, (සංවර්ධන නිලධාරි) | | | |
| 19 | නලින්ද කොස්තා මහතා, (සංවර්ධන නිලධාරි) | කසල ශෝධන අංශය යටතේ JICA හි මූලෝපායික ප්‍රධාන සැලැස්ම සඳහා වූ ව්‍යාපෘති සඳහා ජපන් ප්‍රතිපාර්ශවීය වැඩසටහන (II අවධිය) | ජපානය | 2017 10.23 සිට 11.01 දක්වා |
| 20 | ඩබ්.ඒ. එන්. තිලංග මහතා, (සංවර්ධන නිලධාරි) | විද්‍යා හා තාක්ෂණික සංවර්ධනය පිළිබඳ දැනුම හා තොරතුරු හුවමාරු වැඩසටහන | කොරියාව | 2017 .07. 16 සිට 22 දක්වා |
| 21 | ඩී.එස්. රණතුංග මිය, (සංවර්ධන නිලධාරි) | දෙවැනි විදේශීය අධ්‍යයන චාරිකාව ජාතික කළමනාකාරිත්ව ආයතනය (SLIDA හරහා ) | ඉන්දියාව | 2017 .05.15 සිට 24 දක්වා |

## 3.2 ගිණුම් අංශය

### 3.2.1 වගකීම

**අමාත්‍යාංශයේ අයවැය ඇස්තමේන්තුව අනුව මූල්‍ය කාර්යයන් ඉටුකිරීම**

### 3.2.2 අංශය මගින් ඉටුකරනු ලබන ප්‍රධාන කාර්යයන්

1. අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල හා විදේශ ව්‍යාපෘති සම්බන්ධව වාර්ෂික ඇස්තමේන්තු පිළියෙල කර ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම හා වාර්ෂික අයවැය මගින් වෙන් වන ප්‍රතිපාදන සීමාවන් තුළ වියදම් කළමනාකරණය කර ගනිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය කරගෙන යාමට සහය ලබා දීම.
2. මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කළ යුතු පහත සඳහන් කාලීන වාර්තා අදාල කාල සීමාවන්ට ඉදිරිපත් කිරීම.

| වාර්තාව | | කාල රාමුව |
|---|---|---|
| වාර්ෂික අක් මුදල් පත්‍රය | - | වර්ෂයේ වැඩ කරන පළමු දිනයේ දී |
| වාර්ෂික අක් මුදල් සැලැස්ම | - | වර්ෂය ආරම්භයේ දී |
| වාර්ෂික අක් මුදල් ඉල්ලුම් පත්‍රය | - | සෑම මසකම වැඩ කරන පළමු දින |
| වාර්ෂික ප්‍රසම්පාදන සැලසුම | - | අදාල වර්ෂය ආරම්භයේ දී |

3. භාණ්ඩාගාරය සමග සම්බන්ධීකරණය කරමින් විදේශ ව්‍යාපෘති සඳහා හා අනිකුත් සංවර්ධන ව්‍යාපෘති සඳහා අක් මුදල් ලබා ගැනීම හා එම මුදල් ව්‍යාපෘති අතර බෙදා හැරීම.
4. විදේශ ව්‍යාපෘතිවල මුදල් ගෙවීම්වලට අදාල ඉල්ලුම් පත්‍ර (withdrawal application) භාණ්ඩාගාරය මගින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.
5. මූල්‍ය කටයුතු විධිමත්ව පවත්වාගෙන යාම, මුදල් රෙගුලාසි, භාණ්ඩාගාර චක්‍රලේඛ හා නියෝගවලට අනුකූලව අදාල ගෙවීම් හා ලැබීම් ගිණුම්ගත කිරීම හා භාණ්ඩාගාරයට වාර්තා කිරීම.
6. අමාත්‍යාංශයේ හා අදාල ආයතන හා විදේශ ව්‍යාපෘතිවල භාණ්ඩ සමීක්ෂණ කටයුතු සම්බන්ධීකරණය කිරීම හා අදාල වාර්තා විගණකාධිපති හා අනිකුත් ආයතන වෙත ලබාදීම.
7. චක්‍රලේඛ පරිදි අදාල ගිණුම් වාර්තා පිළියෙල කිරීම හා අදාල ආයතන වෙත නියමිත දිනට ලබාදීම.
8. කොන්ට්‍රෝලර් ජනරාල් වෙත අදාල වාර්තා සැපයීම, අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලින් යැවිය යුතු වාර්තාවල ප්‍රගතිය තහවුරු කර ගැනීම
9. අමාත්‍යාංශ ප්‍රසම්පාදන කටයුතු

### 3.2.3 2017.12.31 දිනට ප්‍රගතිය

ශීර්ෂ අංකය : 162
අමාත්‍යාංශයේ පුනරාවර්තන වියදම්
කාණ්ඩය - පුද්ගල පඩිනඩි හා වෙනත් පුනරාවර්තන වියදම්

(රු.මිලියන)

| විස්තරය | ප්‍රතිපාදන | මුළු වියදම | ප්‍රතිශතය % |
|---|---|---|---|
| අමාත්‍ය කාර්යාලය | | | |
| පුද්ගල පඩිනඩි | 20.30 | 17.80 | 88% |
| අනිකුත් පුනරාවර්තන වියදම් | 23.42 | 21.55 | 92% |
| **එකතුව** | **43.72** | **39.35** | **90%** |
| ආයතන හා පරිපාලන සේවා | | | |
| පුද්ගල පඩිනඩි | 81.50 | 77.09 | 95% |
| අනිකුත් පුනරාවර්තන වියදම් | 220.35 | 203.83 | 93% |
| **එකතුව** | **301.85** | **280.92** | **93%** |
| මුළු එකතුව | **345.57** | **320.27** | **93%** |

ප්‍රාග්ධන වියදම්

(රු.මිලියන)

| විස්තරය | ප්‍රතිපාදන | මුළු වියදම | ප්‍රතිශතය % |
|---|---|---|---|
| අමාත්‍ය කාර්යාලය | | | |
| පුනරුත්ථාපන | 3.01 | 1.24 | 41% |
| අත්පත් කර ගැනීම් | 2.93 | 1.94 | 66% |
| **එකතුව** | **5.94** | **3.18** | **54%** |
| ආයතන හා පරිපාලන සේවා | | | |
| පුනරුත්ථාපනය | 2.85 | 1.82 | 64% |
| අත්පත් කර ගැනීම් | 7.05 | 6.64 | 94% |
| හැකියා වර්ධනය | 1.21 | 1.17 | 97% |
| **එකතුව** | **11.11** | **9.63** | **87%** |
| මුළු එකතුව | **17.05** | **12.81** | **75%** |

### නාගරික යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ප්‍රාග්ධන වියදම

| විස්තරය | ප්‍රතිපාදන | වියදම | අතැති බිල්පත් (නොගෙවූ) | මුළු වියදම | ප්‍රතිශතය % |
|---|---|---|---|---|---|
| **මුළු එකතුව** | **37,272.09** | **27,240.95** | **4,449.04** | **31,689.99** | **85%** |
| නාගරික සංවර්ධන අධිකාරිය | 1,442.50 | 690.70 | 519.97 | 1,210.67 | 84% |
| ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව | 1,107.50 | _ | 873.15 | 873.15 | 79% |
| හම්බන්තොට ජාත්‍යන්තර සම්මේලන මධ්‍යස්ථානය | 299.43 | 265.63 | 33.80 | 299.43 | 100% |
| කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය -ලෝක බැංකුව | 3,000.00 | 2,347.06 | _ | 2,347.06 | 78% |
| කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය - දේශීය | 1,177.00 | 1,176.99 | _ | 1,176.99 | 100% |
| මහපකොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය | 425.00 | 425.00 | _ | 425.00 | 100% |
| උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය (නුවර සහ ගාල්ල) - ලෝක බැංකුව | 2,614.00 | 1,851.16 | _ | 1,851.16 | 71% |
| උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය (නුවර සහ ගාල්ල) - දේශීය | 499.00 | 499.00 | _ | 499.00 | 100% |
| මහ කොළඹ ප්‍රදේශයේ ගංවතුර වැළැක්වීමේ හා පරිසර සංවර්ධන ව්‍යාපෘතිය | 392.70 | 362.35 | _ | 362.35 | 92% |
| මහ කොළඹ ගංවතුර පාලනය සඳහා වූ නාගරික පරිසරහාර අරමුදල | 72.16 | 72.15 | _ | 72.15 | 100% |
| මහ කොළඹ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය | 1,545.00 | 108.36 | 1,800.00 | 1,908.36 | 124% |
| බස්නාහිර පළාත් මහානගර සංවර්ධන සැලසුම | 85.00 | 52.34 | _ | 52.34 | 62% |
| මැනිං වෙළඳ සංකීර්ණය - පැලියගොඩ | 1,358.60 | 841.50 | 500.00 | 1,341.50 | 99% |
| නගර උපාංග සංවර්ධන හා නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | 1,000.00 | 260.53 | _ | 260.53 | 26% |
| යෝජිත මහානගර ව්‍යාපෘති කාර්යාල ස්ථාපනය කිරීම | 219.00 | 210.12 | _ | 210.12 | 96% |
| උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය (යාපනය ) -දේශීය | 6.00 | 3.52 | _ | 3.52 | 59% |
| උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය (අනුරාධපුරය) - දේශීය | 59.00 | 54.25 | _ | 54.25 | 92% |
| වරාය නගර ව්‍යාපෘතිය | 2,709.32 | 2,709.29 | _ | 2,709.29 | 100% |
| ත්‍රිකුණාමල දිස්ත්‍රික් මහ සැලසුමම පිළියෙල කිරීම | 91.00 | 69.54 | _ | 69.54 | 76% |
| පළාත් නවයෙහි නගර සංවර්ධනය | 800.00 | 510.55 | _ | 510.55 | 64% |
| සැහැල්ලු දුම්රිය සංක්‍රමණ ව්‍යාපෘතිය (GoSL/JICA) | 31.00 | 30.30 | _ | 30.30 | 98% |
| බේරේ වැව පුනරුත්ථාපනය සහ ප්‍රතිසංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | 150.00 | 150.00 | _ | 150.00 | 100% |
| මාතර ගං ඉවුරු සංවර්ධනය | 150.00 | 95.20 | _ | 95.20 | 63% |
| නාගරික පුනර්ජීවන වැඩසටහන | 8,500.00 | 8,500.00 | _ | 8,500.00 | 100% |

| විස්තරය | ප්‍රතිපාදන | වියදම | අතැති බිල්පත් (නොගෙවූ) | මුළු වියදම | ප්‍රතිශතය % |
|---|---|---|---|---|---|
| දඹල්ල දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම | 200.00 | 198.50 | _ | 198.50 | 99% |
| පොදු ප්‍රවාහනය සඳහා බස් සේවාව දියුණු කිරීම | 200.00 | 104.02 | _ | 104.02 | 52% |
| බෝගම්බර බන්ධනාගාර සීමාව නැවත සංවර්ධන ව්‍යාපෘතිය | 25.00 | 17.94 | _ | 17.94 | 72% |
| **අයවැය යෝජනාව (රු.මි. 7,500)** | | | | | |
| 01. ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති - සුබිත පුරවර | 2,995.90 | 2,944.55 | _ | 2,944.55 | 98% |
| 02. දෙවන අදියර ව්‍යාපෘතිය සුබිත පුරවර | 1,500.00 | 1,219.53 | _ | 1,219.53 | 81% |
| 03. ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ ගංවතුර පාලනය සඳහා වන ව්‍යාපෘති | 2,500.00 | 989.55 | 603.00 | 1,592.55 | 64% |
| 04. ගංවතුර පාලන මධ්‍යස්ථානය | 400.00 | 238.94 | _ | 238.94 | 60% |
| 05. කුඩානගර සහ සිහිලැල් දැහැන ව්‍යාපෘතිය- සුබිත පුරවර | 250.00 | 175.63 | 119.12 | 294.75 | 118% |

| **අවම මූල්‍ය ප්‍රගතියක් සහිත ව්‍යාපෘති පිළිබඳ විස්තර** | | | |
|---|---|---|---|
| උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය (යාපනය) - ලෝක බැංකුව | 335.00 | 40.14 | ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතුවල සිදු වූ ප්‍රමාදයන් මත සැලසුම් කළ පරිදි ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමට නොහැකි වීම. |
| උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය (අනුරාධපුරය) - ලෝක බැංකුව | 275.00 | – | සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමේ කටයුතුවලට අදාල සමාජ හා පාරිසරික ආරක්ෂණ බලපෑම් හා අදාල නිර්දේශ මත විස්තරාත්මක ව්‍යාපෘති සැලසුම සකස් කිරීමේ උපදේශාත්මක කොන්ත්‍රාත්තුව පිරිනැමීම ප්‍රමාද වීම. |
| නාගරික සංවර්ධන අධිකාරිය සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් අයිකොනික් ගොඩනැගිල්ල ඉදි කිරීම | 500.00 | – | භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ 2017/07/09 දිනැති ලිපිය මගින් මෙම ප්‍රතිපාදන භාවිතා නොකරන ලෙස උපදෙස් ලබා දී ඇත. |
| ඌරුබොක්ක නගර සංවර්ධන ව්‍යාපෘතිය | 64.80 | _ | අතිරේක ප්‍රතිපාදන වශයෙන් වර්ෂයේ අග භාගයේ මෙම මුදල් ලැබුණු පසුව ප්‍රසම්පාදන කටයුතු නිම කිරීම හා ඉන් පසු ටෙන්ඩර් පිරිනැමීමට සිදු වූ බැවින් ප්‍රතිපාදන භාවිතා නොවීම. |
| හම්බන්තොට වෙරළ උද්‍යාන සංවර්ධනය හා සිරිබෝපුර වෙළඳ සංවර්ධනය | 43.18 | – | 2017 අග භාගය තුළ අතිරේක ප්‍රතිපාදන ලෙස මෙම මුදල් ලැබීම නිසා බිල්පත නිදහස් කිරීමට ප්‍රමාණවත් කාලයක් නොමැති වීම. |
| **අයවැය යෝජනාව (රු.මි. 7,500)** ලේක් ඩ්‍රයිව් මාර්ගයේ | 250.00 | 26.61 | පැවති පාලම පුළුල් කිරීම, පාලම දකුණු පසින් ඇති ඇළ මාර්ගය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් කරන ලද යෝජනා අනුව සැලසුම නැවත වෙනස් කිරීමට අවශ්‍යවීම, එකී වෙනස්කම් සහිතව මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අවසාන සැලසුම 2017.12.11 දින ඉදිරිපත් කිරීම යනාදී හේතූන් මත ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට පමා වීම. |

## 3.3 නාගරික සංවර්ධන අංශය

නාගරික සංවර්ධන, සැලසුම් හා මෙහෙයුම්, ඉඩම් සහ නාගරික පරිසර කළමණාකරණ යන අංශ මෙම අංශය යටතේ පවතී.

### 3.3.1 නාගරික සංවර්ධන අංශය

#### i. අංශයේ වගකීම

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති නාගරික සංවර්ධන අධිකාරිය හා අනෙකුත් ව්‍යාපෘති මගින් සිදුකරනු ලබන සියලුම පොදු සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය නීත්‍යානුකූල අනුමැතිය ලබාදීම හා සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

#### ii. නාගරික සංවර්ධන අංශය මගින් ඉටුකරනු ලබන ප්‍රධාන කාර්යයන්

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති නාගරික සංවර්ධන අධිකාරිය හා අනෙකුත් ව්‍යාපෘතිවල සම්බන්ධීකරණ හා අධීක්ෂණ කටයුතු, අමාත්‍ය මණ්ඩල සංදේශ අධීක්ෂණය හා අදාල අනුමැතිය ලබාදීම, නාගරික සංවර්ධන බල ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම, නාගරික සංවර්ධන සැලසුම් ප්‍රකාශයට පත් කිරීම හා සම්බන්ධ කාර්යයන් අධීක්ෂණය හා අනුමැතිය ලබාදීම, නාගරික සංවර්ධන අධිකාරියට අදාලව මහජන පැමිණිලි, අනවසර ඉදිකිරීම් හා රාජ්‍ය ආයතන මගින් ඉදිරිපත් කරනු ලබන ලිපි සම්බන්ධයෙන් අදාල කටයුතු කිරීම.

එසේම, අමාත්‍යාංශය වෙත ලැබෙන භාණ්ඩාගාර ප්‍රතිපාදන හරහා සුබිත පුරවර වැඩසටහන ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම හා ඇගයීම සිදු කිරීම.

#### iii. 2017.12.31 දිනට ප්‍රගතිය

ඉහත ii හි සඳහන් ප්‍රධාන කාර්යයන් පහත සඳහන් විෂයයන් යටතේ සිදු කරනු ඇත.

- නාගරික සංවර්ධන අධිකාරිය මගින් ඉඩම් බැහැර කිරීම සම්බන්ධයෙන් වන අදාළ පනත්, නීති රීති, රෙගුලාසිවලට අදාළව කටයුතු සම්බන්ධීකරණය කිරීම
- නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩම් බැහැර කිරීමට අදාළව අධිකාරිය මගින් ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල යෝජනා කෙටුම්පත් පරීක්ෂා කිරීම හා අධීක්ෂණය කිරීම
- ඉඩම් බැහැර කිරීමට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය සඳහා යොමු කිරීම හා අමාත්‍ය මණ්ඩල තීරණ සම්බන්ධයෙන් අදාළ කටයුතු ඉටු කිරීම
- වාණිජමය ව්‍යාපෘති, කර්මාන්ත ව්‍යාපෘති, ආයෝජන මණ්ඩල ව්‍යාපෘති, නගර සංවර්ධන සැලසුම් ව්‍යාපෘති රාජ්‍ය ආයතන, ව්‍යවස්ථාපිත මණ්ඩල හා ආගමික, පුණ්‍යායතන හා සමාජ සේවා ආයතන සඳහා ඉඩම් බදු දීම්, අදාළ ලිපිලේඛන පරීක්ෂා කිරීම හා නාගරික සංවර්ධන අධිකාරිය සතු නිවාස යෝජනාක්‍රම හා වෙළඳ සංකීර්ණ ඒකක බැහැර කිරීම සම්බන්ධ කටයුතු කිරීම
- ඉහත ඉඩම් බැහැර කිරීම්වලට අදාළව 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 18.1 වගන්තිය යටතේ විෂයභාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම
- සුබිත පුරවර ව්‍යාපෘතිය යටතේ ලංසු කැඳවීමේ ලේඛන පරීක්ෂා කර ලංසු කැඳවීම, ලංසු විවෘත කිරීම, ඇගයීම හා ප්‍රදානය කිරීම, ප්‍රගති සමාලෝචනය සිදු කිරීම, උපදේශක ආයතන මගින් ලබා දෙන බිල්පත් පරීක්ෂා කර මුදල් ගෙවීමේ සහතික සකස් කර ගෙවීම සඳහා ගිණුම් අංශය වෙත යොමු කිරීම
- මහමග මිතුරෝ ව්‍යාපෘතියට අදාළ රාජකාරි කටයුතු කිරීම
- ඉඩම් බැහැර කිරීම්වලට අදාළව ජනාධිපති කාර්යාලය, අමාත්‍යාංශ හා වෙනත් ආයතන මගින් යොමු කරන ලද ලිපි සම්බන්ධ අධීක්ෂණය කිරීම හා සම්බන්ධීකරණය කිරීම

- ඉඩම් ආඥා පනත (නැවත පවරා ගැනීම) යටතේ නාගරික සංවර්ධන අධිකාරියට අයත් දේපලවල අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීම හා අදාල දේපල නැවත පවරා ගැනීමට අදාලව 1979 අංක 7 දරණ රජයේ ඉඩම් සන්තකය ආපසු ලබා ගැනීමේ පනත යටතේ ඉදිරිපත් කරනු ලබන 14(2) බී වගන්තිය යටතේ වන සහතිකය පරීක්ෂා කිරීම, සකස් කිරීම හා රජයේ ඉඩම් සන්තකය ආපසු ලබා ගැනීමේ පනත යටතේ ඉදිරිපත් කරනු ලබන ලබන 14 (2) බී වගන්තිය යටතේ වන සහතිකය ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය සඳහා යොමු කිරීම හා එම තීරණවලට අදාළ කටයුතු කිරීම
- නාගරික සංවර්ධන අධිකාරියේ නගර සංවර්ධන ව්‍යාපෘතිවලට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ අධීක්ෂණය හා අනුමැතිය සඳහා යොමු කිරීම හා අමාත්‍ය මණ්ඩල තීරණ සම්බන්ධයෙන් අදාල පසුවිපරම් කිරීම
- නාගරික සංවර්ධන අධිකාරිය විසින් නාගරික ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධව සම්බන්ධීකරණ කටයුතු කිරීම
- පහත සඳහන් ව්‍යාපෘතින්හි අමාත්‍ය මණ්ඩල පත්‍රිකා හා අනෙකුත් අනුමැතීන් සඳහා ඉදිරිපත් කරනු ලබන ලිපි අධීක්ෂණය කිරීම හා අදාල සංශෝධන සිදු කිරීමෙන් අනතුරුව ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම

    - වරාය නගර ව්‍යාපෘතිය
    - උපාය මාර්ගික නාගරික සංවර්ධන ව්‍යාපෘතිය
    - මහ කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය
    - ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය සඳහා ප්‍රධාන සැලසුම සකස් කිරීම

- මැනිං වෙළඳපොළ පුනස්ථාපනය කිරීමේ ව්‍යාපෘතියේ ලංසු කැඳවීම, ලංසු විවෘත කිරීම, ඇගයීම හා ප්‍රදානය කිරීම, ප්‍රගති සමාලෝචනය සිදු කිරීම
- ගංවතුර පාලන හා ජල කළමනාකරණ මධ්‍යස්ථානය පිහිටුවීමේ ව්‍යාපෘතියේ ලංසු කැඳවීම, ලංසු විවෘත කිරීම, ඇගයීම හා ප්‍රදානය කිරීම, ප්‍රගති සමාලෝචනය සිදු කිරීම

### 3.3.2 සැලසුම් සහ මෙහෙයුම් අංශය

**i. වගකීම**

වාර්ෂික ප්‍රතිපාදන අනුව අමාත්‍යාංශය හා අනුබද්ධ ආයතන, දෙපාර්තමේන්තු හා ව්‍යාපෘති මගින් සිදුකිරීමට නියමිත සංවර්ධන වැඩසටහන් පිළිබඳ තොරතුරු ඇතුළත් අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාත්මක සැලසුම සකස් කිරීම, අදාල මෙහෙයුම් ආයතන වෙත එය ඉදිරිපත් කිරීම, එකී වාර්ෂික සැලැස්ම ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව අධීක්ෂණය කරමින් අවශ්‍ය මග පෙන්වීම් සිදුකිරීම හා එහි ප්‍රගතිය අදාළ පාර්ශව වෙත වාර්තා කිරීම මෙම අංශයේ වගකීම වේ.

**ii. අංශය මගින් ඉටුකරනු ලබන ප්‍රධාන කාර්යයන්**

අමාත්‍යාංශය වෙනුවෙන් වාර්ෂික ක්‍රියාත්මක සැලසුම සකස් කිරීම හා අදාල අධීක්ෂණ ආයතන වෙත එය ඉදිරිපත් කිරීම, වාර්ෂික සැලසුම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය අධීක්ෂණය කිරීම හා අදාල ආයතන වෙත ඒ පිළිබඳව වාර්තා කිරීම, අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනවල සැලසුම්, මෙහෙයුම් හා ප්‍රගති සමාලෝචන කටයුතු සම්බන්ධීකරණය කිරීම, අමාත්‍යාංශය හා අනුබද්ධ ආයතන විසින් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන ව්‍යාපෘති යෝජනා පිළිබඳ අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම, වාර්ෂික කාර්යසාධන වාර්තාව හා අයවැය විවාදය වෙනුවෙන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍යාංශයේ ප්‍රගති වාර්තාව සකස් කිරීම.

**iii. 2017.12.31 දිනට ප්‍රගතිය**

- 2017 වර්ෂයේ අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලසුම සකස් කිරීම හා අදාළ ආයතන වෙත නියමිත කාලවකවානුතුළ ඉදිරිපත් කිරීම.
- අයවැය විවාදය - 2018 වෙනුවෙන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා "ප්‍රගති වාර්තාව - 2017" සකස් කිරීම
- 2017 වර්ෂයේ දී දිවයින පුරා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත විවිධ සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරිය මගින් ඉදිරිපත් කළ ව්‍යාපෘති යෝජනා 45ක් සහ ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව ඉදිරිපත් කළ ව්‍යාපෘති යෝජනා 19ක් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම
- ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව - 2017 සකස් කිරීම සඳහා මෙම අමාත්‍යාංශයට අදාළ තොරතුරු ඉදිරිපත් කිරීම
- අමාත්‍යාංශයේ වාර්ෂික සැලසුම ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ප්‍රගති වාර්තා සකස් කර ජනාධිපති ලේකම් කාර්යාලය, ජාතික අයවැය දෙපාර්තමේන්තුව, ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව හා අදාළ අනෙකුත් ආයතන වෙත ඉදිරිපත් කිරීම

## 3.3.3 ඉඩම් අංශය

**i. වගකීම**

අමාත්‍යාංශය යටතේ ඇති ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව, නාගරික සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව සහ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති මගින් සිදුකරනු ලබන සියලුම පොදු සංවර්ධන කටයුතු සඳහා එම ආයතනවල අවශ්‍යතාවය අනුව ඉඩම් අත්කර ගැනීම හා රජයේ ඉඩම් පවරා ගැනීම සම්බන්ධයෙන් සහාය වීම හා අමාත්‍යාංශය වෙනුවෙන් ආයතන අතර සම්බන්ධීකරණ කාර්යය සිදු කිරීම.

**ii. ඉඩම් අංශය මගින් ඉටුකරනු ලබන ප්‍රධාන කාර්යයන්**

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව, නාගරික සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව සහ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති මගින් ඉටුකරනු ලබන සංවර්ධන කාර්යයන් සඳහා ඉඩම් අත්කර ගැනීම, පවරා ගැනීම, ඉඩම් අවසතු කිරීම හා ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම සම්බන්ධ අමාත්‍යාංශය වෙනුවෙන් සම්බන්ධීකරණ කාර්යය හා එයට අදාළ අනෙකුත් කාර්යයන් සිදු කිරීම.

**iii. 2017.12.31 දිනට ප්‍රගතිය**

අමාත්‍යාංශය යටතේ ඇති ඉහත ආයතන සහ ව්‍යාපෘතිවලින් ලැබෙන ඉල්ලීම පරිදි පහත දැක්වෙන ව්‍යාපෘතිවලට අදාළව ඉඩම් අත්කර ගැනීම, පවරා ගැනීම, ඉඩම් අවසතු කිරීම හා ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම සම්බන්ධව අමාත්‍යාංශය වෙනුවෙන් සම්බන්ධීකරණ කාර්යය හා එයට අදාළ අනෙකුත් කාර්යයන් ඉටු කර ඇත.

- ගුවන් නගර සංවර්ධන ව්‍යාපෘතිය
- ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය
- නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය
- කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය

- උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය
- විද්‍යා හා තාක්ෂණික නගර ව්‍යාපෘතිය
- සුබිත පුර ව්‍යාපෘතිය
- පිබිදෙමු පොළොන්නරුව
- ගම්පහ නගර සංවර්ධන ව්‍යාපෘතිය
- විසල් හම්බන්තොට ව්‍යාපෘතිය
- විසල් මහනුවර ව්‍යාපෘතිය
- පේරාදෙණිය නගර සංවර්ධන ව්‍යාපෘතිය
- අනුරාධපුර පූජානගර සංවර්ධන ව්‍යාපෘතිය
- රත්නපුර නව නගර සංවර්ධන ව්‍යාපෘතිය

### 3.3.4 නාගරික පරිසර කළමනාකරණ අංශය

වර්තමාන හා අනාගත පරපුර සඳහා සුවදායි නාගරික පරිසරයක් ලබා දීම සහතික කරනු වස් 2017 වර්ෂයේ ජුනි මාසයේ දී මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය මගින් නාගරික පරිසර කළමනාකරණ අංශය ස්ථාපිත කරන ලදී. මෙම අංශය ස්ථාපිත කිරීමේ ප්‍රධාන අරමුණු පහත දැක්වේ:

- නාගරික පුරවැසියන් හා නගරයට දිනපතා පැමිණෙන පිරිසට සුවදායි නාගරික පරිසරයක් ලබාදීම සුරක්ෂිත කිරීම සඳහා අදාළ වන ප්‍රතිපත්ති හා එම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට අදාළ ක්‍රමෝපායන් හා මාර්ග නිර්දේශ සකස් කිරීම.
- බස්නාහිර හා මහානගර සැලසුමට සමගාමීව සකස් කරන ලද උපායමාර්ගික පාරිසරික ඇගයුමෙහි හඳුනා ගන්නා ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහතික කිරීම.
- තිරසාර සංවර්ධන අභිමතාර්ථ අංක 11ට (තිරසර නගර හා ජනාවාස නිර්මාණය) අදාළ වූ ක්‍රියාකාරකම් ඉටු කිරීම සඳහා සම්බන්ධීකරණය සහ පහසුකම් සැලසීම.
- මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති පාරිසරික සුරක්ෂිතතාව සුරැකෙන පරිදි ඉටු කිරීම සඳහා අදාළ උපදේශකත්වය ලබාදීම.
- නාගරික පරිසරය ආරක්ෂා කිරීම සඳහා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය, තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය වැනි අදාල ආයතන සමග සම්බන්ධීකරණය කිරීම.

පරිසර කළමනාකරණ අංශය මගින් මෙම අමාත්‍යාංශය හා ඒ යටතේ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති පරිසරය සුරක්ෂිත කරමින් සිදු කිරීම සහතික කිරීමට අදාළ කටයුතු ඉටු කරනු ලැබේ. ප්‍රධාන වශයෙන්ම වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය හා අරුවක්කාළු ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය ඇතුළු අනෙකුත් ප්‍රධාන ව්‍යාපෘති මගින් ඇති විය හැකි අහිතකර පාරිසරික ගැටළු අවම කරමින් එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වටපිටාව සකස් කර දීමට කටයුතු කර ඇත. වරාය නගර ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සකස් කර ඇති පාරිසරික කළමනාකරණ සැලසුම නිසි පරිදි ක්‍රියාත්මක කිරීම පිළිබඳව නිරන්තර මෙහෙයවීම (Monitor) සිදු කරනු ලබයි. මහානගර සැලසුමට සමගාමීව සකස් කරන ලද උපායමාර්ගික පාරිසරික ඇගයුමේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අදාළ කටයුතු ඉටු කරනු ලැබේ. තිරසාර අභිමතාර්ථ අංක 11ට අදාළව තිරසාර නගර පිළිබඳව ක්‍රියාකාරී සැලසුමේ කෙටුම්පත සකස් කර ඇත. තෙත්බිම් සංරක්ෂණය හා නැවත භාවිතය මූලික කර ගනිමින් සංවර්ධනයත් සමග තෙත්බිම් ආරක්ෂා කර ගැනීම සඳහා මහවැලි හා පරිසර අමාත්‍යාංශය සමඟ කටයුතු කරනු ලැබේ.

## 3.4 මහානගර සැලසුම් අංශය

### 3.4.1 වගකීම

ප්‍රතිපත්ති සැකසීම, උපායමාර්ග හඳුනා ගැනීම සහ මහානගර මූලාරම්භය හා සම්බන්ධ ව්‍යාපෘති අනුමත කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ප්‍රගති සමාලෝචනය

### 3.4.2 අංශය මගින් ඉටු කරනු ලබන ප්‍රධාන කාර්යයන්

- බස්නාහිර කලාපීය ගුවන් නගර සංවර්ධන ව්‍යාපෘතිය, බස්නාහිර කලාපීය පරිපාලන නගර සංවර්ධන ව්‍යාපෘතිය, බස්නාහිර කලාපීය තාක්ෂණික නගර සංවර්ධන ව්‍යාපෘතිය, බස්නාහිර කලාපීය සමුද්‍රීය නගර සංවර්ධන ව්‍යාපෘතිය, බස්නාහිර කලාපීය ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය, බස්නාහිර කලාපීය සැලසුම් ව්‍යාපෘතිය සහ ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය මගින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති හා සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය, අධීක්ෂණය හා ඇගයීම
- මහානගර මූලාරම්භයන් හා සැලසුම් සම්බන්ධව වෘත්තීයවේදීන් ඇතුළු විවිධ ආයතන හා සමාජ කණ්ඩායම් දැනුවත් කිරීම තුළින් ඔවුන්ගේ අදහස් ලබා ගැනීම හා එම අදහස් ප්‍රතිපත්ති සැකසීම හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගැනීම
- මහානගර සංවර්ධනයට අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ආයෝජන සපයා ගැනීම අරමුණු කර ගනිමින් විවිධ ජාත්‍යන්තර ආයතන හා තානාපති කාර්යාල සමග සම්බන්ධීකරණය.
- මහානගර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අරමුණු කරගත් අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම සම්බන්ධයෙන් වූ කාර්යයන් සම්බන්ධීකරණය
- අමාත්‍යාංශයේ විෂයපථයට අයත් විවිධ ජාත්‍යන්තර දින සැමරීම අරමුණු කරගත් උත්සව (උදා: ලෝක නගර දිනය) හා අමාත්‍යාංශය යටතේ වූ වෙනත් දේශීය උත්සව අමාත්‍යාංශයේ අනෙකුත් අංශ හා අමාත්‍යාංශය යටතේ වූ ආයතන සමග සම්බන්ධ වී සංවිධානය කිරීම
- ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් යුතුව අමාත්‍යාංශයේ සතිපතා පවත්වන ප්‍රගති සමාලෝචන රැස්වීම සම්බන්ධීකරණය
- ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව හා ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවට අදාළ සංවර්ධන කටයුතු ව්‍යාපෘති හා ඉඩම් සම්බන්ධ කටයුතු අධීක්ෂණය හා සම්බන්ධීකරණය
- මහානගර ව්‍යාපෘති හා ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට අදාළ මහජන පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියා කිරීම
- මහානගර ව්‍යාපෘතිවලට, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව හා ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවට අදාළ කැබිනට් පත්‍රිකා සැකසීම හා අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීම
- මහානගර ව්‍යාපෘතීන්ට අදාළව පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු සැකසීම සම්බන්ධීකරණය
- මහානගර ව්‍යාපෘතීන්ට අදාල මෙහෙයුම් කමිටු සංවිධානය හා සම්බන්ධීකරණය.
- ව්‍යාපෘති ඇගයීම් කමිටුව සම්බන්ධීකරණය
- කුඩා නගරවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම පිණිස සුබිත පුරවර හා සිහිලැල් දැහැන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- කොළඹ, කළුතර හා ගම්පහ යන දිස්ත්‍රික්කවලට අදාල විමධ්‍යගත අයවැය වැඩසටහන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය හා අදාල දිස්ත්‍රික් ලේකම් කාර්යාල සමග සම්බන්ධීකරණය හා ව්‍යාපෘති අනුමත කිරීම
- මහානගර ව්‍යාපෘතිවලට අදාල ක්‍රියාකාරී සැලසුම් සැකසීම හා එහි ප්‍රගති සමාලෝචනය

## 3.4.3 2017.12.31 දිනට ප්‍රගතිය

### 1. ජාත්‍යන්තර සහයෝගීතාව, වෙළඳපොළ ස්ථාපිත කිරීම සහ ප්‍රවර්ධනය, ආයෝජන ආරක්ෂණය

මහානගර ප්‍රධාන සැලසුම යටතේ හඳුනා ගන්නා ලද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ආයෝජන ආරක්ෂණය සඳහා විදේශීය දූත ගමන්, රැස්වීම් සහ සාකච්ඡා පැවැත්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් ගනු ලැබ ඇත. එමෙන්ම, තාක්ෂණික සහයෝගිතා ප්‍රවර්ධනය, තාක්ෂණ හා ආයෝජන හවුල්කරුවන් හඳුනා ගැනීම සහ සෘජු විදේශ ආයෝජන ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් රාජ්‍යයන් අතර (G to G) මෙන්ම රාජ්‍ය හා ව්‍යාපාරික ආයතන සමගත් (G to B) සබඳතා ශක්තිමත් කිරීම සඳහා විභවතා සහිත හවුල්කාර රටවල් කිහිපයක සංචාරය කිරීමට අමාත්‍යාංශ නිලධාරීන්ට අවස්ථාව ලැබී ඇත. ද්විපාර්ශවීය/බහුපාර්ශවීය සාකච්ඡා, අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම් හා එකඟතා, ව්‍යාපාරික සමුළු සහ මහානගර ක්‍රියාකාරකම් ජාත්‍යන්තරව ප්‍රවර්ධනය කිරීම ද මෙයට ඇතුළත්ය.

**ද්විපාර්ශවික සාකච්ඡා, වැඩමුළු හා දූත ගමන් - 2017**

| | කාර්යය | දිනය |
|---|---|---|
| 1 | සිදු කළ හැකි ආයෝජන අවස්ථා පිළිබඳව යුරෝපා කණ්ඩායමේ නියෝජිතයින් සමග සාකච්ඡාව | 2017 ජන. 17 සහ 2017 ජූලි 31 |
| 2 | ශ්‍රී ලංකාවේ සිදු කළ හැකි ආයෝජන අවස්ථා පිළිබඳව දැනුවත් කිරීම සඳහා පින්ලන්ත තානාපතිතුමා සමග පැවති ද්වි-පාර්ශවික සාකච්ඡාව | 2017 පෙබ. 06 |
| 3 | අත්සන් කළ අවබෝධතා ගිවිසුම අනුව, SEIMENS සින් "සුහුරු මහානගර සඳහා තාක්ෂණික මැදිහත් වීම පිළිබඳව අවසන් කෙටුම්පත" ඉදිරිපත් කිරීම | 2017 මාර්තු 30 |
| 4 | ප්‍රවර්ජන අංශයට අදාළ දත්ත රැස් කිරීමේ සමීක්ෂණය සඳහා JICA සමීක්ෂණ කණ්ඩායමේ සංචාරය | 2017 අප්‍රේල් 05 සිට 2017 මැයි 23 |
| 5 | ස්වීඩනයේ Fotum සමාගමේ නියෝජිතයින්ගේ සංචාරය හා කසලවලින් විදුලිය නිපදවීම පිළිබඳව පින්ලන්ත ව්‍යාපාරික නියෝජිතයන් සමඟ සාකච්ඡාව | 2017 අප්‍රේල් 28 සිට 2017 ජූනි 30 |
| 6 | තාක්ෂණ නගර ව්‍යාපෘතියේ කෙටුම්පත් සැලසුම සඳහා විවිධ ආයතන නියෝජනය කරනු ලබන රාජ්‍ය නිලධාරීන්ගේ අදහස් හා මත විමසීම සඳහා කොරියානු නියෝජිතයින්ගේ ශ්‍රී ලංකා සංචාරය | 2017 මැයි 19 |
| 7 | තොරතුරු හුවමාරුව සඳහා ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමේ කොරියානු සංචාරය | 2017 ජූලි 16 සිට 22 |
| 8 | විභව ආයෝජන අවස්ථා පිළිබඳව සාක්ච්ඡාවක් සඳහා ස්වීඩන් - ශ්‍රී ලංකා ව්‍යාපාර සභාවේ මහ ලේකම්තුමාගේ සංචාරය | 2017 මැයි 25 |
| 9 | ව්‍යාපාරික ප්‍රජාව හමුවීම සඳහා අමාත්‍යාංශ නියෝජිතයින් විසින් ඩෙන්මාර්ක් හා ස්වීඩන්හි කළ සංචාරය | 2017 ජූනි 06 සිට 09 |
| 10 | කොළඹ - ත්‍රිකුණාමල ආර්ථික මංපෙතේ කටයුතුවලට පහසුකම් සැලසීම සඳහා කොරියාවේ පැවති ආයෝජිකයින්ගේ සමුළුව හා දැනුම හුවමාරු කිරීමේ වැඩසටහන | 2017 ජූනි 26 සිට 30 |
| 11 | ප්‍රතිපත්තිමය උපදේශන පත්‍රිකා හුවමාරු කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකු කණ්ඩායමේ සංචාරය | 2017 ජූලි 31 සිට අගෝස්තු 31 |
| 12 | ශ්‍රී ලංකාවේ සිදු කළ හැකි ආයෝජන අවස්ථා ගවේෂණය කිරීම සඳහා ජපාන Marubeni සමාගමේ නියෝජිත කණ්ඩායමේ සංචාරය | 2017 ඔක්තෝම්බර් 10 |

## 2. සිහිලැල් දැහැන ව්‍යාපෘතිය

අධ්‍යාත්මික සංවර්ධනය තුළින් පුද්ගල සතුට වැඩිකිරීම අරමුණු කර ගනිමින් ආරම්භ කරන ලද සිහිලැල් දැහැන වැඩසටහන කොළඹ, ගම්පහ, කළුතර දිස්ත්‍රික්කයන්හි ක්‍රියාත්මක කරන ලදී. බෞද්ධ, හින්දු, කතෝලික හා මුස්ලිම් යන සියලු ආගම්වලට අයත් ආගමික ස්ථානයන්හි පරිසරය ආරක්ෂා කරමින් යටිතල පහසුකම් සංවර්ධනය අරමුණු කර දියත් කරන ලද මෙම වැඩසටහන්හි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින් සිදු කරනු ලැබේ.

| ක්‍රියාත්මක කිරීමේ අධිකාරිය | නිම කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව | ව්‍යාපෘතිවල වටිනාකම (රු.මි) |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස | 38 | 54.15 |
| කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස | 5 | 7.09 |
| ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස | 29 | 21.10 |
| **එකතුව** | **72** | **82.34** |

## 3. "සුඛිත පුරවර" කුඩා නගර සංවර්ධන වැඩසටහන - අමාත්‍යංශයේ මැදිහත්වීම

නාගරික සංවර්ධන අධිකාරියෙන් ඉදිරිපත් කරන ලද "සුඛිත පුරවර" ප්‍රධාන වැඩසටහනට සමගාමීව බස්නාහිර පළාතේ ප්‍රධාන නගර හා සම්බන්ධ තදාසන්න නගරවල මූලික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා කුඩා නගර සංවර්ධන වැඩසටහන ආරම්භ කර ඇත. නාගරික සංවර්ධන අධිකාරියේ බල ප්‍රදේශයට අයත් නොවන බැවින් ප්‍රාදේශීය ලේකම් කාර්යලවල මැදිහත් වීම යටතේ මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරේ.

**ව්‍යාපෘතියේ අරමුණු**

- නගරය පරිහරණය කරන්නන්ගේ සුව පහසුව වැඩිදියුණු කිරීම
- නගරය ජීවත්වීමට සුදුසු තැනක් බවට පත් කිරීම
- සියලු ජන කොටස්වලට ප්‍රතිලාභ ලැබෙන පරිදි නාගරික හා ආර්ථික කටයුතු ඉහළ නැංවීම

**"සුඛිත පුරවර" කුඩා නගර සංවර්ධන වැඩසටහනේ ප්‍රගතිය.**

| දිස්ත්‍රික්කය | | නිම කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව | වටිනාකම (රු.මි.) |
|---|---|---|---|
| කොළඹ | අදියර I | 125 | 74.92 |
| | අදියර II | 78 | 35.42 |
| කළුතර | | 45 | 23.26 |
| ගම්පහ | අදියර I | 24 | 32.19 |
| | අදියර III | 83 | 35.85 |
| **එකතුව** | | **355** | **201.64** |

## 4. කොළඹ, කළුතර හා ගම්පහ දිස්ත්‍රික්කවල විමධ්‍යගත අයවැය වැඩසටහන (DCB)

අදාළ දිස්ත්‍රික්කවල ආර්ථික, සාමාජීය, සංස්කෘතික හා ආගමික අභිවෘද්ධිය සහතික කරනු පිණිස මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. බස්නාහිර පළාතේ දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ (ජාතික ලැයිස්තු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැර) ව්‍යාපෘති යෝජනා නිර්දේශ කර ඉදිරිපත් කිරීමෙන් පසු ඒවා අනුමත කිරීම මෙම අමාත්‍යාංශය මගින් සිදු කෙරේ. 2017 වසර සඳහා එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට රුපියල් මිලියන 10ක් වෙන් කර ඇති අතර පහත ක්ෂේත්‍ර යටතේ යෝජනා ඉදිරිපත් කෙරේ.

- ග්‍රාමීය ප්‍රවේශ මාර්ග හා එම ප්‍රදේශවල පානීය ජල සැපයුම වැඩිදියුණු කිරීම
- ප්‍රාථමික/ද්විතියික පාසල්වල හා ග්‍රාමීය සෞඛ්‍ය මධ්‍යස්ථානවල යටිතල පහසුකම් සැපයීම
- ලියාපදිංචි කල සමිති, පෙර පාසල්, ළමා නිවාස, වැඩිහිටි නිවාස, දහම් පාසල්, ආගමික, සංස්කෘතික සංවිධානවලට පහසුකම් හා උපකරණ ලබා දීම
- ප්‍රජා යටිතල පහසුකම් සංවර්ධන හා නවීකරණ වැඩසටහන්
- කුඩා වාරිමාර්ග පහසුකම් ඉදිකිරීම හා නවීකරණය කිරීම, කාන්තාවන් හා තරුණ තරුණියන් ඉලක්ක කර ගනිමින් විශේෂ වෘත්තීය පුහුණු හා රැකියා පහසුකම් සැලසීම

**විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ සම්බන්ධීකරණය කළ වැඩසටහන් - 2017**

| දිස්ත්‍රික්කය | ව්‍යාපෘති සංඛ්‍යාව | ව්‍යාපෘති වටිනාකම (රු.මි.) |
|---|---|---|
| කොළඹ | 1046 | 167.38 |
| කළුතර | 531 | 98.04 |
| ගම්පහ | 704 | 165.87 |
| **එකතුව** | **2281** | **431.29** |

## 5. දැනුවත් කිරීම් හා පුහුණු වැඩසටහන්

- තිරසර ලංකා ප්‍රදර්ශනය සඳහා නාගරික සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව හා ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව සමග එක්ව ප්‍රදර්ශන කුටියක් සංවිධානය කරන ලදී

- මහානගර සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වැඩමුළුවක් අගෝස්තු 29 දින අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් සෙත්සිරිපාය පරිශ්‍රයේ දී පවත්වන ලදී

- අමාත්‍යාංශය හා මහානගර සංවර්ධන ව්‍යාපෘති නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් කුසලතා සංවර්ධන වැඩසටහනක් සැප්තැම්බර් 15, 16 හා 17 යන තෙදින මාදුරු ඔය විශේෂ බලකා පුහුණු මධ්‍යස්ථානයේ දී පවත්වන ලදී

## 6. ප්‍රගති සමාලෝචනය

- ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වනු ලබන ප්‍රගති සමාලෝචන රැස්වීම් සෑම සතියකම සඳුදා දින අමාත්‍යාංශය, අමාත්‍යාංශය යටතේ පවතින සියලු ආයතන හා ව්‍යාපෘති ප්‍රධානීන්ගේ සහභාගීත්වයෙන් පවත්වනු ලබන අතර එහි සම්බන්ධීකරණ කටයුතු හා ප්‍රගතිය සම්බන්ධ පසු විපරම් කටයුතු මහානගර අංශය මගින් සිදු කරනු ලබයි.
- මෙයට අමතරව මහානගර ව්‍යාපෘතීන්ට අවශ්‍ය උපදෙස් ලබා දීම සඳහා මෙහෙයුම් කමිටු පත් කිරීම හා එම මෙහෙයුම් කමිටු සම්බන්ධීකරණය ද මහානගර අංශය මගින් සිදු කරනු ලැබේ.
- තවද, 2017 වර්ෂය තුළ දී බස්නාහිර කලාපීය ගුවන් නගර සංවර්ධන ව්‍යාපෘතිය, බස්නාහිර කලාපීය පරිපාලන නගර සංවර්ධන ව්‍යාපෘතිය, බස්නාහිර කලාපීය තාක්ෂණික නගර සංවර්ධන ව්‍යාපෘතිය, බස්නාහිර කලාපීය සමුද්‍රීය නගර සංවර්ධන ව්‍යාපෘතිය, බස්නාහිර කලාපීය ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය, බස්නාහිර කලාපීය සැලසුම් ව්‍යාපෘතිය සහ ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය යන ව්‍යාපෘති සඳහා කාර්යය මණ්ඩල බඳවා ගැනීමට අදාළ සම්මුඛ පරීක්ෂණ පවත්වා ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් ඇතුළු කාර්ය මණ්ඩලය බඳවා ගැනීමෙන් අනතුරුව ව්‍යාපෘති කාර්යාල ස්ථාපිත කිරීම සඳහා කටයුතු කරන ලදී.

## 1.5 තාක්ෂණ අංශය

### 3.5.1 අංශයේ වගකීම

අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටු සම්බන්ධීකරණය කිරීම හා එහි ගන්නා තීන්දු තීරණ අමාත්‍යාංශය යටතේ ඇති ආයතන හා ව්‍යාපෘති හරහා ක්‍රියාවේ යෙදවීමට කටයුතු කිරීම සහ අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ සේවාවන්ට අදාළ කාර්යයන් නිසි පරිදි පවත්වාගෙන යාම.

### 3.5.2 අංශය මගින් ඉටු කරනු ලබන ප්‍රධාන කාර්යයන්

- ප්‍රසම්පාදනයට අදාළ කමිටු පත් කිරීම සඳහා කටයුතු කිරීම
- ප්‍රසම්පාදන රැස්වීම් සංවිධානය කිරීම
- ප්‍රසම්පාදන තීරණ පිළියෙල කිරීම හා ඒවා අදාළ ආයතන සඳහා යොමු කිරීම
- ලංසු විවෘත කිරීම් සඳහා අවශ්‍ය කටයුතු කිරීම
- ප්‍රසම්පාදන වාර්තා මාසිකව යාවත්කාලීන කර භාණ්ඩාගාරය වෙත යොමු කිරීම
- අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය ත්‍රෛභාෂිකව යාවත්කාලීන කිරීම සහ තොරතුරු පනත අනුව අවශ්‍ය තොරතුරු වෙබ් අඩවියේ පළ කිරීමට කටයුතු කිරීම
- සියළුම මාණ්ඩලික නිලධාරින්ට නිල විද්‍යුත් ලිපිනයක් ලබාදීම සම්බන්ධයෙන් කටයුතු කිරීම
- අන්තර්ජාල පහසුකම් අඛණ්ඩව පවත්වාගෙන යාම සහ අදාළ සම්බන්ධීකරණ කටයුතු කිරීම
- අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණයට අදාළ දෘඩාංග සහ මෘදුකාංග ගැටළු නිරාකරණය කිරීම, ස්ථාපිත කිරීම සහ පරිශීලකයන් දැනුවත් කිරීම
- පරිගණක පද්ධති සඳහා ආරක්ෂිත මුරපද ලබා දීම සහ පරිගණක පරිශීලක ගිණුම් පාලනය කිරීම
- අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ මෙවලම් සම්බන්ධ ප්‍රසම්පාදන කටයුතුවල දී පිරිවිතර සැකසීම සහ තාක්ෂණ ඇගයුම් කමිටුවල කටයුතු කිරීම
- තොරතුරු තාක්ෂණ විෂයට අදාල තොරතුරු, තොරතුරු තාක්ෂණ නියෝජිත ආයතනය හා අනෙකුත් ආයතන සමග සම්බන්ධීකරණය කිරීම
- "ජනපතිට කියන්න" වැඩසටහනට අවශ්‍ය තාක්ෂණික සහය ලබා දීම

### 3.5.3 2017.12.31 දිනට ප්‍රගතිය

- ව්‍යාපෘති ප්‍රසම්පාදන කාර්යයන් සාර්ථකව සම්පූර්ණ කර ටෙන්ඩර් ප්‍රදානය කර ඇත. එහි වටිනාකම රුපියල් 32,973,637,009.70
- ලංකා රාජ්‍ය ජාල ව්‍යාපෘතිය "2.0" අමාත්‍යාංශයේ ස්ථාපිත කිරීම පිණිස මූලික කටයුතු සිදු කිරීම

## 1.6 අභ්‍යන්තර විගණන අංශය

### 1.6.1 වගකීම

ආයතනයේ අරමුණුවලට ලඟාවීම සඳහා මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය සහ විටින් විට නිකුත් කරනු ලබන විවිධ චක්‍රලේඛවලට අනුකූලව ආයතනය මෙහෙයවනු ලබන්නේද යන්න විගණනය කිරීම.

### 3.6.2 අංශය මගින් ඉටුකරනු ලබන ප්‍රධාන කාර්යයන්

- වාර්ෂික විගණන සැලසුම පිළියෙල කිරීම
- කළමනාකරණ හා විගණන කමිටු කැඳවීම
- අමාත්‍යාංශයේ වාර්ෂික අභ්‍යන්තර විගණනය සිදුකිරීම
- විදේශ ආධාර පාදක ව්‍යාපෘති විගණනය
- මහානගර හා බස්නාහිර සැලසුම විගණනය
- මහානගර හා බස්නාහිර සැලසුම යටතේ වන ව්‍යාපෘති විගණනය
- නාගරික සංවර්ධන අධිකාරියේ කටයුතු අධීක්ෂණය
- ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවෙහි කටයුතු අධීක්ෂණය
- ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවෙහි කටයුතු අධීක්ෂණය
- විශේෂ විමර්ෂණ පැවැත්වීම

### 3.6.3 2017 .12.31 දිනට ප්‍රගතිය

3.6.2 හි සඳහන් අංශය මගින් ඉටුකරනු ලබන ප්‍රධාන කාර්යයන් ඉටු කිරීම සම්බන්ධයෙන් අදාළ වර්ෂයේ විගණන සැලැස්මට අනුව විගණන කටයුතු සිදු කර ඇත.

## 2. අමාත්‍යාංශය යටතේ පවතින ව්‍යවස්ථාපිත ආයතන සහ දෙපාර්තමේන්තු

- **ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව**

1946 අංක 13 දරණ නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනත මගින් පිහිටුවන ලද නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුව, 2000 අගෝස්තු 9 වන දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව මගින් ඒකමතිකව අනුමත කළ 2000 අංක 49 දරන නගර හා ග්‍රාම නිර්මාණ (සංශෝධිත) පනත යටතේ, 2001 මැයි මස 21 වන දින ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව ලෙස නැවත ස්ථාපිත කරන ලදී.

අධ්‍යාත්මික හා සාමාජීය ක්‍රියාකාරකම් සඳහා යටිතල පහසුකම් සැලසීමේ අරමුණින් යුතුව ලෝලුගස්වැව - අනුරාධපුර නව නගර ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයන කටයුතු නිම කර අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. එමෙන්ම, පූජා භූමි සැලසුම් යෝජනා ක්‍රමය ක්‍රියාවට නැංවීම, මහනුවර, කැළණිය, කෝට්ටේ, සේරුවිල අළුවිහාරය යන පූජා භූමි සඳහා සංවර්ධන සැලසුම් සකස් කර ඒවා පවත්වාගෙන යාම ආගමික ස්ථානවල යටිතල පහසුකම් නැංවීමේ ව්‍යාපෘති ද සිදු කර ඇත.

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් එහි අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රධාන කාර්යසාධන දර්ශක 2017 වර්ෂයේ දී සකස් කර ඇත.

- **නාගරික සංවර්ධන අධිකාරිය**

1978 අංක 41 දරණ පාර්ලිමේන්තු පනත මගින් නාගරික සංවර්ධන අධිකාරිය පිහිටුවනු ලැබ ඇති අතර ඒකාබද්ධ සැලසුම්කරණය හා නාගරික සංවර්ධන විෂයභාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රදේශවල ආර්ථික, සාමාජීය හා භෞතික සංවර්ධනය ක්‍රියාවට නැංවීම එහි ප්‍රධාන කාර්යභාරය වේ.

නාගරික සංවර්ධන අධිකාරිය මගින් නාගරික යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති 56ක්, මහජන උපයෝගීතා සහ පාරිසරික සංවර්ධනය කිරීම ව්‍යාපෘති 43ක්, ප්‍රවාහන කටයුතු සඳහා පහසුකම් සැලසීමේ ව්‍යාපෘති 26ක්, පූජා භූමි සංවර්ධන කිරීමේ ව්‍යාපෘති 15ක්, විනෝදාත්මක පහසුකම් සැලසීමේ ව්‍යාපෘති 25ක් සහ පහසුකම් ප්‍රතිස්ථාපනය ව්‍යාපෘති 4ක් 2017 වර්ෂයේ සිදු කර ඇත.

නාගරික සංවර්ධන අධිකාරිය විසින් කොළඹ නගරය සහ එයට ආසන්න ප්‍රදේශවල අඩු පහසුකම් සහිත ජනාවාස නැවත ප්‍රතිස්ථාපනය කිරීම සඳහා නිවාස ඒකක 60000ක් ඉදි කිරීමේ අරමුණින් නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය ආරම්භ කර ඇත. මේ වන විට ප්‍රධාන ව්‍යාපෘති 5ක් යටතේ නිවාස ඒකක 874ක පවුල් ප්‍රතිස්ථාපනය කර ඇත. එමෙන්ම, නිවාස ඒකක 10,636ක් සහිත ව්‍යාපෘති 16ක් ආරම්භ කර ඇති අතර ඉන් ව්‍යාපෘති 3ක් සම්පූර්ණයෙන් අවසන් කර ඇත.

නාගරික සංවර්ධන අධිකාරිය විසින් මූල්‍යාමය දෘෂ්ටිකෝණය, ගනුදෙනු කරුවන්ගේ දෘෂ්ටිකෝණය, ක්‍රියාවලි පිළිබඳ දෘෂ්ටිකෝණය සහ ඉගෙනුම් හා වර්ධන දෘෂ්ටිකෝණය යටතේ එහි කාර්යසාධනය මැන බැලීම සඳහා ශේෂ ලකුණු දීමේ කාඩ්පත භාවිතා කරනු ලබයි.

විශේෂිත දෘෂ්ටිකෝණයක් තුළ නියමිත ඉලක්ක වලට පටහැනි සෑම ක්‍රියාවකම ප්‍රතිඵල ග්‍රහණය කිරීම පිණිස කළමනාකරණ උපකරණ පුවරුවක් හඳුන්වා දී තිබෙන අතර එමගින් සියලුම පළාත් ආවරණය කරනු ලැබේ. එසේම, කාර්ය මණ්ඩලයේ දැනුම, කුසලතා සහ ආකල්ප මැනීම සඳහා කාර්ය මණ්ඩලයේ ඇගයීමක් ද සිදු කර ඇති අතර ඒ තුළ ඉලක්ක ගත වනුයේ නාගරික සංවර්ධන අධිකාරියේ එක් එක් පුද්ගලයාගේ අනුප්‍රාප්තික මාර්ගය වැඩිදියුණු කිරීම වේ.

- **ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව**

ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව යනු 1976 අංක 27 දරණ පනතින් ද 1982 අංක 52 දරණ පනතින් ද 2006 අංක 35 දරණ පනතින් ද සංශෝධිත, 1968 අංක 15 දරණ කොළඹ දිස්ත්‍රික් (පහත් බිම් ප්‍රදේශ) ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ මණ්ඩල පනත යටතේ මූලික වශයෙන් පිහිටුවන ලද සංස්ථාපිත මණ්ඩලයකි.

මේ යටතේ වේරුස් ගඟ අපජලය බැහැර කිරීම හා පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, ඔලියමුල්ල පොම්පාගාර ව්‍යාපෘතිය හා දික්ඕවිට වාන් දොරටු ඉදිකිරීම, කළුඔය ද්‍රෝණියේ අපජලය බැහැර කිරීම හා පරිසරය වැඩිදියුණු කිරීමේ වයාපෘතියට අදාළ මූලික අදියරේ කටයුතු සිදුකිරීම, තෙත්බිම් සංරක්ෂණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, ඇළ මාර්ග සහ වැව් නඩත්තු කිරීමේ ව්‍යාපෘති සිදුකිරීම තුළින් කොළඹ නගරය තුළ සිදුවන නිරන්තර ජල ගැලීම අවම කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. එමෙන්ම කෙරවලපිටිය කසල කළමනාකරණ ඒකකය ආරම්භ කිරීම තුළින් කොළඹ නගරයේ එක් රැස්වන ඝන අපද්‍රව්‍ය ගැටළුවටද පිළියම් ලබා දී ඇත. රාගම ප්‍රදේශයේ මධ්‍යම ආදායම් නිවාස ව්‍යාපෘතියක් මෙන්ම නාරාහේන්පිට සුඛෝපභෝගී නිවාස සංවර්ධන ව්‍යාපෘතියක් ඉදිකිරීමට ද අවශ්‍ය මූලික සැලසුම් කටයුතු සිදුකර ඇත.

මූල්‍යාමය, ක්‍රියාවලි වැඩිදියුණු කිරීම, නවෝත්පාදනය /පාරිභෝගික තෘප්තිය සහ සේවක වර්ධනයට හා සංවර්ධනය වැනි මූලික බාණ්ඩ හතරක් මත පදනම් වූ කළමනාකරණ ලකුණු දර්ශකයේ සමස්ත මාසික ප්‍රගතිය හඳුනා ගැනීම පිණිස ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ මූලික ක්‍රියාකාරිත්වයන් සමග ප්‍රධාන කාර්යසාධන දර්ශක පෙළ ගස්වනු ලැබේ. මෙම උපාංග නිවැරදිව යොමු කිරීම සඳහා 2017 වර්ෂයේ සිට ලබා දුන් කාර්යසාධනය අනුව ප්‍රාථමික මට්ටමේ (PL 1) සිට කළමනාකාර මට්ටම (MM 1_1) දක්වා වූ සේවකයින්ට ක්‍රමෝපායික ප්‍රතිලාභ ක්‍රමයක් හඳුන්වා දෙන ලද අතර 2017 වර්ෂය තුළ සේවකයින් 28 දෙනෙකුට ප්‍රතිලාභ ලබා දී ඇත.

# 5. අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති

## 5.1 විදේශීය අරමුදල් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති

- **කොළඹ අගනගරය ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය**

කොළඹ ජල ද්‍රෝණිය ආශ්‍රිත පෝෂක ප්‍රදේශයේ ගංවතුර බලපෑම් අවම කිරීම හා තෝරා ගත් ආදර්ශන ආයෝජන තුළින් ප්‍රාදේශීය මට්ටමේ යටිතල පහසුකම් හා සේවා පුනරුත්ථාපනය, වැඩිදියුණු කිරීම හා පවත්වාගෙන යාම සඳහා කොළඹ නගරය ආශ්‍රිතව පිහිටි පළාත් පාලන ආයතනවල හැකියාව ශක්තිමත් කිරීම යනාදී අරමුණු පෙරදැරිව ක්‍රියාත්මක කෙරෙන මෙම ව්‍යාපෘතිය සඳහා ලෝක බැංකුව මගින් ණය පහසුකම් ලබා දේ. ව්‍යාපෘතියේ මුළු පිරිවැය ඇ.ඩො.මිලි. 223 (නැවත පදිංචි කිරීම, තීරු බදු හා බදු රහිතව) වන අතර ව්‍යාපෘති කාල සීමාව 2012 ජූලි මස 10 දින සිට ඉදිරියට වසර පහකි.

කොළඹ ජල ද්‍රෝණියේ ජලාපවහන ධාරිතාව වැඩිදියුණු කිරීම, කුඩා ජලාපවහන පද්ධති පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම, ගංවතුර හා ජලාපවහන කළමනාකරණය සහ ධාරිතාව වැඩි කිරීම හා බේරේ වැව ආශ්‍රිත රේඛීය උද්‍යානය සහ බැද්දගාන උද්‍යානය ඉදි කිරීම මේ යටතේ සිදු කරනු ලබයි. මේ වන විට සම්පූර්ණ කර ඇති ව්‍යාපෘති ගණන 14 කි. එමෙන්ම, ඉදිකෙරෙමින් පවතින ව්‍යාපෘති ගණන 9ක් වන අතර ටෙන්ඩර් අදියරේ හා සැලසුම් අදියරේ පවතින ව්‍යාපෘති ගණන පිළිවෙලින් 11 හා 02කි.

- **කොළඹ අගනගරය ආශ්‍රිත ගංවතුර බලපෑම් අවම කිරීමේ හා නාගරික පරිසර භාර අරමුදල**

රජයේ ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් කොළඹ අගනගරය ආශ්‍රිත ප්‍රදේශයේ ගංවතුර බලපෑම් අවම කිරීම, සහතික කිරීම සඳහා මෙම ආධාර මුදල ලබා දී ඇත. ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ මූලික ආයතනයයි. මේ යටතේ තෙත් බිම් කළමනාකරණ උපායමාර්ග සකස් කිරීම, මහ කොළඹ කලාපයේ ගංවතුර අවදානම පිළිබඳ ඇගයුමක් සිදු කිරීම මෙන්ම අදාල නිලධාරින්ගේ ධාරිතා වර්ධනය කිරීම ද සිදු කර ඇත.

- **උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය (මහනුවර, ගාල්ල, යාපනය, අනුරාධපුරය)**

මෙරට ඉදිරි සංවර්ධන කටයුතුවල දී උපාය මාර්ගිකව වැදගත්කමක් උසුලන නගර හඳුනාගෙන ඒවා සංවර්ධනය කිරීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වේ. ලෝක බැංකුව (WB), ආසියානු සංවර්ධන බැංකුව (ADB) සහ ප්‍රංශ සංවර්ධන ආයතනය (AFD) වැනි ආයතනවල මූල්‍ය හා තාක්ෂණික සහය ඇතිව ශ්‍රී ලංකාවේ උපායමාර්ගික නගර සංවර්ධනය කිරීම පිණිස ආරම්භ කරන ලද මෙම පස් අවුරුදු (2014-2019) ව්‍යාපෘතිය යටතේ පළමුවෙන් අවධානය යොමු කරන ලද්දේ ලෝක උරුම නගර ලෙස ප්‍රසිද්ධියට පත්ව ඇති මහනුවර හා ගාල්ල උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය පිළිබඳවයි. ඒ අනුව මහනුවර නගරයේ වාහන තදබදය ඉවත් කිරීම හා තත්වයෙන් උසස් වූ නාගරික පොදු පහසුකම් හා සේවාවන් සැපයීම මෙන්ම ගාල්ල නාගරික කලාපයේ ජල ගැලීම් අවම කිරීම හා නාගරික පොදු පහසුකම් වැඩිදියුණු කිරීම යනාදී කටයුතු මෙම ව්‍යාපෘතිය යටතේ ඉටු කෙරෙමින් පවතී.

මහනුවර හා ගාල්ල උපායමාර්ගික නගරවලට අමතරව 2016 වර්ෂයේ දී ලෝක බැංකු ණය ආධාර යටතේ ක්‍රියාත්මක පස් අවුරුදු ව්‍යාපෘතියක් ලෙස යාපනය නගරයත් ප්‍රංශ සංවර්ධන ආයතනයේ මූල්‍ය අනුග්‍රහය යටතේ අනුරාධපුර නගරයත් උපාය මාර්ගිකව සංවර්ධනය කළ යුතු නගර වශයෙන් හඳුනාගන්නා ලදී.

- **මහ කොළඹ නාගරික ප්‍රවාහන ජාල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ නගර සංවර්ධන උපාංගය**

මහ කොළඹ නාගරික ප්‍රවාහන ජාල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ නගර සංවර්ධන උපාංගය හෙවත් පිටත වටරවුම් අධිවේගී මාර්ග ව්‍යාපෘතිය (OCH) ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනයේ (JICA) මූල්‍ය අනුග්‍රහයෙන් ක්‍රියාත්මක වේ. 2007 මාර්තු මස 28 වැනි දින වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය හා ජාත්‍යන්තර සහයෝගීතාව පිළිබඳ ජපන් බැංකුව (JBIC) අතර ඇති කරගත් ණය ගිවිසුම මගින් මෙම ව්‍යාපෘතිය සඳහා මූල්‍යාධාර සැපයේ.

පිටත වටරවුම් අධිවේගී මාර්ග ව්‍යාපෘතිය කොළඹ නගරය තුළ හා ඉන් පිටත ඉතා ජනාකීර්ණ හා තදාසන්න නගර සීමාවලින් පිටතට සංවර්ධනය පැතිරවීම හා එහි මාර්ග තදබදය අවම කිරීමේ අරමුණින් ක්‍රියාත්මක වන ප්‍රමුඛතම මාර්ග ව්‍යාපෘතියකි. මේ යටතේ ප්‍රධාන වශයෙන් කොට්ටාව, කඩුවෙල සහ කඩවත **(3K)** යන නගරවල යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සිදු කෙරෙමින් පවතී.

ශක්තිමත් හා තිරසාර ආර්ථික වර්ධනයක් උදෙසා කාලය, ඉන්ධන හා රථ වාහන නඩත්තු පිරිවැය ආදී වටිනා සම්පත් නාස්තිය අවම කිරීම තුළින් මගීන්ගේ ජීවන තත්ත්වය වර්ධනය කිරීම සඳහා උසස් තත්වයේ යටිතල පහසුකම් සැපයීම මෙම ව්‍යාපෘතිය මගින් සිදු කරනු ලබන අතර එහි මූලික අපේක්ෂාව වන්නේ මාර්ග තදබදය, ගමනාන්තයන් සඳහා ගතවන කාලය හා රථ වාහන ආපදා අවම කිරීමත් පෞද්ගලික ප්‍රවාහන පහසුකම් භාවිතය අධෛර්යමත් කරමින් පොදු ප්‍රවාහන සේවා භාවිතය ධෛර්යමත් කිරීමත්ය. මේ යටතේ කොට්ටාව - පන්නිපිටිය, කඩුවෙල ප්‍රදේශයේ මාර්ග දෙකක් මේ වන විටත් ඉදිකර අවසන් කර ඇති අතර කොට්ටාව - මාලඹේ මාර්ගය ඉදිකරමින් පවතී. එමෙන්ම ශ්‍රී ලංකාවේ පළමු බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය ලෙස මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු අවසන් අදියරේ පවතී.

- සැහැල්ලු දුම්රිය ප්‍රවාහන පද්ධති ව්‍යාපෘතිය

බස්නාහිර කලාප මහානගර සැලසුම මගින් අවධාරණය කරන ලද නව මාදිලියේ පොදු ප්‍රවාහන පද්ධතියක් හඳුන්වා දී කොළඹ නගරයේ මාර්ග තදබදයට විසඳුමක් ලබාදීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කර ඇත. ජපන් රජයේ සහයෝගීතාව සහිතව රු.මි. 225000 ක වියදමින් 2017 -2026 කාල පරිච්ඡේදය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත මෙම ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යන කටයුතු 2017 වසරේ දී සිදු කෙරෙමින් පවතී.

## 5.2 දේශීය අරමුදල් යටතේ ක්‍රියාත්මකවන ව්‍යාපෘති

- **බස්නාහිර කලාපීය ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය**

බස්නාහිර කලාපීය මහානගර ප්‍රධාන සැලසුම මගින් හඳුනා ගන්නා ලද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිණිස ස්ථාපිත කර ඇති මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලාංකිකයන් සඳහා වඩාත් ඵලදායී, කාර්යක්ෂම සමාජ ආර්ථික පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ප්‍රවාහන ක්ෂේත්‍රයට සම්බන්ධව හඳුනාගත් බොහෝමයක් ව්‍යාපෘති සිදු කරමින් පවතී. මේ යටතේ කොළඹ දිස්ත්‍රික්කය තුළ කිලෝමීටර් 75ක් පමණ ආවරණය කරමින් ප්‍රධාන මාර්ග 7ක අධිවේගී සැහැල්ලු දුම්රිය පුවාහන පද්ධතියක් ස්ථාපිත කිරීමට අවශ්‍ය මූලික අදියරේ කටයුතු සිදු කරමින් පවතී. කොළඹ කොටුව, කඩවත, බණ්ඩාරගම සහ බත්තරමුල්ල ආදී ප්‍රදේශවල බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථාන ආරම්භ කිරීමට අවශ්‍ය මූලික කටයුතු ආරම්භ කර ඇත. වාහන තදබදය අවම කිරීම සඳහා විකල්ප මාර්ගයක් ලෙස පොල්දූව කොස්වත්ත අතුරු මාර්ගය සංවර්ධනය කිරීම, බස්රථ ප්‍රමුඛතා මංතීරු ව්‍යාපෘතිය යටතේ ප්‍රමුඛතා මංතීරු ව්‍යාපෘති 6ක් ක්‍රියාත්මක කිරීම, නම්‍යශීලී කාර්යාල වේලාවන් හඳුන්වා දීම, අභ්‍යන්තර ජලමාර්ග ආශ්‍රිත මගී ප්‍රවාහන සේවා ඇරඹීමට අවශ්‍ය මූලික කර්තව්‍යයන් ආරම්භ කිරීම යනාදිය සිදු කර ඇත.

- **කොළඹ අගනගරය ආශ්‍රිත ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතිය**

කොළඹ අගනගරය ආශ්‍රිතව දිනකට ඝන අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 1.200 ක් පමණ එක් රැස් වන නමුත් ඒවා ආරක්ෂිතව බැහැර කිරීම සඳහා ක්‍රමවත් යාන්ත්‍රණයක් නොමැති වීමෙන් මෙම ගැටළුව අර්බුදයක් බවට පත්ව ඇත. එබැවින් ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුව විසින් මෙම අර්බුදයට පිළියම් සෙවීමේ වගකීම මෙම අමාත්‍යාංශය වෙත පවරනු ලැබ ඇත.

මේ අනුව, මහ කොළඹ කලාපයේ එක් රැස් වන ඝන අපද්‍රව්‍ය සඳහා පරිසර හිතකාමී, ආර්ථික ශක්‍යතාවයක් හා විධිමත් ක්‍රමවේදයක් සහිත ව්‍යාපෘතියක් සැලසුම් කර ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ මහ කොළඹ කලාපය තුළ එක්රැස් වන නාගරික ඝන අපද්‍රව්‍ය අරුවක්කාළු ප්‍රදේශයේ පිහිටුවීමට නියමිත සනීපාරක්ෂක කසළ රැඳවුම වෙත ප්‍රවාහනය කිරීමට නියමිතය.

එමෙන්ම, කොළඹ නගරය පිරිසිදු නගරයක් කිරීමේ අරමුණින් ආරම්භ කරන ලද නිකසල පුරවර වැඩසටහන යටතේ 3R සංකල්පය අනුව කසල එකතු කිරීමේ මධ්‍යස්ථාන පාසල් මට්ටමින් හා නිවාස සංකීර්ණ මට්ටමින් ස්ථාපිත කිරීම, තෝරාගත් නිවාස සංකීර්ණවල තෝරාගත් පුද්ගලයන් සඳහා කසල කළමනාකරණය පිළිබඳ පුහුණුවක් ලබා දී අදාළ නිවාස සංකිර්ණයන්හි ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන්වල කාර්යභාර නිලධාරින් ලෙස පත්කර ඇත.

- **බස්නාහිර කලාපීය තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතිය**

බස්නාහිර කලාපීය මහානගර ප්‍රධාන සැලසුමට අනුව හෝමාගම, අතුරුගිරිය, මාලඹේ හා කඩුවෙල යන ප්‍රදේශ තාක්ෂණික කලාපයක් ලෙස හඳුනාගෙන සංවර්ධනය කිරීමට අපේක්ෂිතය. මෙම ප්‍රදේශය විශේෂිත සංවර්ධන කලාප හතරකින් සමන්විතය. ජාත්‍යන්තර මට්ටමේ නව නිපැයුම් මධ්‍යස්ථානයක් නිර්මාණය කිරීම පිණිස මානව ප්‍රාග්ධනය රඳවා ගැනීම, යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හා හඳුනාගත් විශේෂිත කලාප සඳහා ආයෝජකයන් ආකර්ෂණය කරගැනීම ද මෙම ව්‍යාපෘතිය මගින් ඉටු කෙරේ. මේ යටතේ කොරියානු උපදේශන කණ්ඩායම විසින් කල්පිත සැලසුම, යටිතල පහසුකම් සැලසුම හා යෝජිත ඉඩම් භාවිත සැලසුම සකස් කර ඇති අතර කල්පිත සැලසුම ව්‍යාපෘති මෙහෙයුම් කමිටුවට ඉදිරිපත් කර ඇත.
එමෙන්ම, මෙම කලාපයේ මාර්ග සංවර්ධන ව්‍යාපෘති 05ක් සඳහා යෝජනා සකස් කර අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කර ඇත. සංවර්ධනය කිරීමට නියමිත ඉඩම් හඳුනාගෙන අත්පත් කර ගැනීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී.

- **බස්නාහිර කලාපීය ගුවන් නගර සංවර්ධන ව්‍යාපෘතිය**

කටුනායක ගුවන් නගරය, ගෝලීය ව්‍යාපාරිකයින් හමුවන හා දැනුම හුවමාරු කෙරෙන අන්තර්ජාතික වශයෙන් වැදගත් වන ගුවන් නගරයක් හා ව්‍යාපාරික ගමනාන්තයක් බවට පත් කිරීමේ දැක්ම පෙරදැරිව ජීවන තත්වය වැඩිදියුණු කිරීම, ආර්ථික සංවර්ධනයට සහායවීම, අනාගත සංවර්ධනයට සමාජ අනුකූලතාවය හා පරිසර සංවර්ධනය යන අරමුණු පෙරදැරිව මහානගර මූලික සැලසුම යටතේ ප්‍රමුඛ ව්‍යාපෘති ලෙස හඳුනාගත් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ පුළුල් කිරීම, ගුවන්තොටුපොළ ව්‍යාපාර නගරය, ගුවන් කේන්ද්‍රස්ථානය, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ හා නගර පිවිසුම්, ප්‍රවර්ධන හා ක්ෂුද්‍ර කාර්මික උද්‍යාන, යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හා නගර වැඩිදියුණු කිරීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන සංවර්ධන උත්ප්‍රේරක වේ. මේ අතුරින් ඒකල ප්‍රවර්ධන හා ව්‍යාපාරික උද්‍යානය, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ පිවිසුම හා කටුනායක 18 කණුවෙහි බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථාන, කටානෙහි ගුවන්තොටුපොළ ව්‍යාපාරික නගරය - කටාන සහ ගුවන් මධ්‍යස්ථානය - දාගොන්න යනාදිය ප්‍රමුඛ සංවර්ධන ව්‍යාපෘති ලෙස හඳුනාගෙන ඇත.

- **බස්නාහිර කලාපීය සමුද්‍රීය නගර සංවර්ධන ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘතිය බස්නාහිර කලාපීය මහානගර සැලසුම මගින් හඳුනා ගන්නා ලද ගුවන් සමුද්‍රීය නගර වෙළඳ මධ්‍යස්ථානය යන තේමාව යටතේ ක්‍රියාත්මක වන අතර මෙමගින් බහුකාර්ය සමුද්‍රීය කලාපයක් සංවර්ධනය කිරීමට අපේක්ෂිතය. මේ යටතේ බ්ලූමැන්ඩල් ප්‍රදේශයේ පහසුකම් ප්‍රර්ධනය හා රේගු පරීක්ෂණ පහසුකම් ව්‍යාපෘතියක්, කොල්ලුපිටියේ සිට දෙහිවල දක්වා විනෝදාත්මක වෙරළ තීරයක් මෙන්ම වැලිසර ප්‍රදේශයන් පහසුකම් ප්‍රවර්ජන උද්‍යානයක් ඉදි කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කෙරෙමින් පවතී.

- **බස්නාහිර කලාපීය පරිපාලන නගර සංවර්ධන ව්‍යාපෘතිය**

රජයේ සියලු ප්‍රධාන පරිපාලනමය කටයුතු සඳහා පහසුකම් සලසන ශ්‍රී ජයවර්ධනපුර පරිපාලන නගරය, රජයේ කාර්යාල සඳහා ප්‍රමාණවත් ඉඩකඩ හා නවීන යටිතල පහසුකම්වලින් සමන්විතව නිර්මාණය කිරීමේ දැක්ම පෙරදැරිව බස්නාහිර කලාපීය මහානගර සැලසුමට අනුකූලව ආරම්භ කර ඇති මෙම ව්‍යාපෘතිය යටතේ බහු මහල් මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති දෙකක් සඳහා යෝජනා කැඳවා ඇත. එමෙන්ම, ප්‍රධාන ගොඩනැගිලි සම්බන්ධකර ඉදිකරනු ලබන ඉහළින් දිවෙන පදික පාලම්, සෙත්සිරිපාය තුන්වන අදියර, යෝජිත පාර්ලිමේන්තු කටයුතු පරිශ්‍රය, පරිපාලන නගරය, සූර්ය විදුලිබල පද්ධති සංවර්ධන ආදී ව්‍යාපෘති සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදු කර ඇත.

- **වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘතිය සීමාසහිත CHEC වරාය නගර (පුද්ගලික) සමාගම මගින් ඍජු විදේශීය ආයෝජන යටතේ සිදු කරන ව්‍යාපෘතියකි. මේ යටතේ හෙක්ටයාර 446.61ක් වූ භූමිය තුළ සංවර්ධනය සඳහා ඉඩම් ලබා ගැනීම පිණිස මුහුදු පතුල ප්‍රදේශයේ හෙක්ටයාර 269ක් ගොඩ කිරීම, වෙරළබඩ දියකඩන, ඉවුරු බදාම, වරාය ද්‍රෝණිය, කලපුව, ඇළ මාර්ග, කෘතිම වෙරළතීර හා අනෙකුත් වෙරළ ආරක්ෂණ ව්‍යුහ ඉදිකිරීම සිදුකරනු ලබයි.

- **ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය සඳහා ප්‍රධාන සැලසුමක් සකස් කිරීම**

2017-2018 කාලපරිච්ඡේදය තුළ රු.මි. 193.3ක් වියදමින් සිංගප්පූරුවේ Surbana Jurong සමාගම විසින් ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය සඳහා ප්‍රධාන සැලසුමක් සකස් කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී. මේ යටතේ ප්‍රධාන සංවර්ධන කලාප 10ක් හඳුනාගෙන ඇති අතර, ඒ සඳහා සංකල්පමය සැලසුම් සකස් කර ඇත. උප්පුවේලි, තාම්පලකාමම්, කින්නියා, මුතූර්, කන්තලේ, නිලාවේලි, පුල්මුඩේ, මොරවැව, සේරුවිල හා ත්‍රිකුණාමලය නගරය ඊට ඇතුළත් වේ.

- **බස්නාහිර කලාප මහානගර ප්‍රධාන සැලසුම් ව්‍යාපෘතිය**

2015 අප්‍රේල් මස 23 වන දිනැති කැබිනට් මණ්ඩල තීරණයට අනුව, ප්‍රතිපත්ති සම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කරන ලද බස්නාහිර කලාපීය මහානගර සැලසුම් ව්‍යාපෘතිය පසුව මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය යටතට පත්කරන ලදී.

මූලික මැදිහත්වීම් තුනක් යටතේ මහානගර සංවර්ධන වැඩසටහන සාර්ථක කරගැනීමට අපේක්ෂා කෙරේ.

- ♦ නාගරීකරණය හරහා නිර්මාණය වන ආර්ථික පිරිමැසුම් මගින් අත්වන වාසිය හා බලය ජාතික ආර්ථිකයට රැගෙන ඒම සඳහා ඉඩකඩ සලසා දීම
- ♦ "අක්‍රමවත් නාගරීකරණය" නිසා නාගරික භෞතික යටිතල පහසුකම්, නාගරික සේවා පහසුකම් හා පරිසරයට එල්ලවී ඇති ව්‍යාකූල පීඩනය තුරන් කිරීම
- ♦ යටිතල පහසුකම් නිර්මාණය සඳහා අවශ්‍ය ඒක පුද්ගල ප්‍රාග්ධන පිරිවැය අඩු කිරීම

## අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය

ඇමුණුම අංක 01

## මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය

